# 2019
# වාර්ෂික වාර්තාව

## රණවිරු සේවා අධිකාරිය
### ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

පටුන

රණවිරු සේවා අධිකාරිය……………………………………………………………..iii

අපේ දැක්ම හා අපේ මෙහෙවර……………………………………………………….iv

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය……………………………………………………...v

සභාපතිතුමන්ගේ පණිවුඩය………………………………………………………….vi

ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය……………………………………………………..vii - viii

අපගේ ක්‍රියාත්මක ව්‍යාපෘති

01. ආබාධිත රණවිරුවන් පුනරුත්ථාපනය සහ රැක බලා ගැනීම……………………….... 1-6
1.1.ආබාධිත උපකරණ , සහයක උපකරණ ලබා දීම
1.2.ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය
1.3.ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු පැවැත්වීම
1.4.ක්‍රීඩා සමාජ ගොඩනැගීම

02. රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම……………………………………7-12
2.1.විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය
2.2.නිවාස ණය ලබා දීම
2.3.හදිසි ආපදාවන්හිදී මූල්‍යාධාර ලබා දීම
2.4.ඉඩම් ලබා දීම

03. වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම…………………………………12-14
3.1.වෛද්‍යාධාර ලබා දීම
3.2.වෛද්‍ය ණය ලබා දීම

04. අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම…….15-17
4.1.රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය
4.2.අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යත්ව ක්‍රමය
4.3.උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර
4.4.මාපිය කැපකරු ශිෂ්‍යත්ව
4.6.කුසලතා ප්‍රවර්ධන ණය

05. ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම…………………………18
5.1.ස්වයං රැකියා ණය ලබා දීම
5.2.ස්වයං රැකියා ආධාර ලබා දීම
5.3.ව්‍යවසාය සංවර්ධන වැඩමුළු පැවැත්වීම

06.අධිකාරියේ කර්තව්‍යයන් සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම.....19-26

6.1. රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන
6.2. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභය
6.3. රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරීම
6.4. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය
6.5. මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු
6.6. යාකබැද්ද - රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය
6.7" විරුසර "වරප්‍රසාද කාඩ්පත
6.8. කාන්තා පවුර රණවිරු උපදේශන ජාලය ගොඩනැගීමේ වැඩසටහන
6.9. "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන
6.10. "විරු බිමට සරු ගසක්" අඹ පැළ රෝපණ වැඩසටහන

07. 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතින් පැවරී ඇති කර්තව්‍ය ඉටුකිරීමේ දී මුහුණ දී ඇති මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ ගැටලුව.......................27-32

විගණකාධිපති වාර්තාව ............................................................33-40

අවසාන ගිණුම් ප්‍රකාශය............................................................41-71

**වාර්ෂික වාර්තාව - 2019** **දෙමළ පරිවර්තනය**

**වාර්ෂික වාර්තාව - 2019** **ඉංග්‍රීසි පරිවර්තනය**

# රණවිරු සේවා අධිකාරිය

මානවයා ශිෂ්ටාචාර ගොඩනගමින් ක්‍රම ක්‍රමයෙන් දියුණු ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමේ දී තම වර්ගයාගේ හා ශිෂ්ටාචාරයේ ආරක්ෂාව සඳහා පුහුණු පූර්ණ කාලීන ආරක්ෂකයන් යොදා ගනිමින් ආරක්ෂක සේවාව වෘත්තීමය තත්ත්වයකට පත් කර ගැනීමට කටයුතු කර ඇති ආකාරයක් පැරණි ශිෂ්ටාචාර පිළිබඳ අධ්‍යයනයෙන් අනාවරණය කර ගත හැක. ඒ අනුව ඉතා ඈත අතීතයේ සිට ආරක්ෂක සේවාවන් වෘත්තීයක් ලෙස සංවිධානගතව වර්තමානයේ ඉතා දියුණු තාක්ෂණික මෙවලම්, යුද උපකරණ හා යුධෝපක්‍රම භාවිත කරන තත්ත්වයට පත්ව ඇත. යුද්ධයේ දී තම වර්ගයාගේ හා ශිෂ්ටාචාරයේ පැවැත්ම වෙනුවෙන් ලබන වැටුපට සීමා නොවී කටයුතු කරන ආරක්ෂක සේවාවන්හි නියුක්ත වූවන් ඈත අතීතයේ පමණක් නොව වර්තමානයේ ද වීරත්වයට ඔසවා තැබීමටත්, ඔවුන්ගේ යැපෙන්නන් සුරක්ෂිතව රැකබලා ගැනීමටත් දියුණු ශිෂ්ට සම්පන්න ජාතීන් කටයුතු කර ඇත.

වර්තමානය වන විට ලෝක භූ දේශපාලනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමට බලවත් ජාතීන් ත්‍රස්තවාදය, සිවිල් අරගල හා ගරිල්ලා සටන් උපයෝගී කරගෙන ඇත. එලෙස මිනිසා විසින් නිර්මාණය කර ඇති යුද ගැටුම් මානවයා බිහිසුණු ව්‍යසනයකට හසු කිරීමට සමත්ව ඇත.

ජාතියක් ලෙස ශ්‍රී ලංකාවට ද දශක තුනකට ආසන්න කාලයක් උතුරු නැගෙනහිර කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වූ ලොව බිහිසුණුම ත්‍රස්තවාදී උවදුරකට මුහුණ දීමට සිදු විය. එහි දී ආරක්ෂක අංශ සාමාජිකයින් හුදු වැටුප අරමුණු කර ගත් වෘත්තීමය එළඹුමකින් ඔබ්බට ගොස් රාජ්‍ය හා එහි වැසියන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ජීවිත හා ශරීරාංග පරිත්‍යාගයෙන් කටයුතු කර ඇත.

ඔවුන් මුහුණ පෑ බිහිසුණු යුද ව්‍යසනය හේතු කොටගෙන ජීවිත පරිත්‍යාග කළ රණවිරු පවුල්වල ළඟම ඥාතීන් හා ශරීරාංග පරිත්‍යාග කළ රණවිරුවන් ඇතුළු ළඟම ඥාතීන් මානසිකව, සාමාජයීයව මෙන් ම ආර්ථිකව කඩා වැටීමකට ලක් වීම නොවැළැක්විය හැකි කරුණක් වී තිබුණි.

යුද වින්දිත ආරක්ෂක අංශ සාමාජික සාමාජිකාවන් හා එම පවුල්වල සාමාජික සාමාජිකාවන්ට වැටුප් හා දීමනා හිමිගන්වමින් ආර්ථික කඩා වැටීමෙන් ඔවුන් මුදවා ගැනීමට යුද තත්ත්වය ආරම්භක අවධියේ ම රජය කටයුතු කර ඇත. 1999 අංක 54 දරන පනතින් ස්ථාපිත කරන ලද රණවිරු සේවා අධිකාරිය මගින් දශක දෙකක කාලයක් අඩුපාඩුවක්ව පැවති විධිමත් මනෝ සාමාජයීය පුනරුත්ථාපන කටයුතු ඉටු කරනු ලබන සිවිල් ආයතනයක අවශ්‍යතාවය සම්පූර්ණ විය. වර්තමානය වන විට "රණවිරු සේවා අධිකාරිය" ප්‍රජා මූලික පුනරුත්ථාපන කටයුතු ඉටු කරනු ලබන ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්ව ඇත.

# අපේ දැක්ම....

රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම

# අපේ මෙහෙවර....

ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සුරක්ෂිත කරනු පිණිස
ජීවිත පුද කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත වූ රණවිරුවන්
සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා
සාමාජයීය ස්ථාවරභාවයක් ඇති කිරීම මෙන් ම සේවයේ
නියුතු රණවිරුවන් සහ එම පවුල්වල මානසික ප්‍රබෝධයක්
ඇති වන අයුරින් ක්‍රියා කිරීම

# 1999 අංක 54 දරන පනත අනුව රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍යයන්

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii)ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

# රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන්ගේ පණිවුඩය....



ක්‍රියාන්විතයේ දී ජීවිත පරිත්‍යාග කළ හා ශරීරාංග පරිත්‍යාග කළ රණවිරුවන්ගේ සුභසාධනය හා ඔවුන් රැකබලා ගැනීමේ කටයුතු ඉටු කිරීම 1999 අංක 54 දරන පනතින් රණවිරු සේවා අධිකාරිය වෙත පැවරී ඇත.

2019 වර්ෂයේ දී රණවිරු සේවා අධිකාරියේ සේවාවන් සේවාලාභී රණවිරු ප්‍රජාව වෙත ළඟා කරලීමේ දී ගුණාත්මක බවින් ඉහළ සේවාවක් ලබා දීමට කටයුතු සැලසුම් කර ඒවා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.

වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද 100% ආබාධිත ප්‍රතිශතයක් සහිත රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම හා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමත්, රණවිරු පවුල් සාමාජිකයින්ගේ අවශ්‍යතා සොයා බලමින් ඔවුන්ට සහායවීමත් ආයතනයක් වශයෙන් අප සතු ප්‍රමුඛ වගකීම වේ. සභාපතිවරයා වශයෙන් පත්ව, ගත වී ඇති කෙටි කාලය තුළ රණවිරුවන්ට සමීප වෙමින් ඔවුන් සමග කටයුතු කිරීම සඳහා රණවිරු සේවා අධිකාරියේ පළාත් හා දිස්ත්‍රික් නිලධාරින් හා කාර්ය මණ්ඩලය එක්ව නව වැඩ පිළිවෙලක් වෙනුවෙන් අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීමට හැකියාවක් ලැබුණි. ගෙවී ගිය 2019 වර්ෂය තුළ අවම පිරිවැයක් දරමින් රණවිරු සේවා අධිකාරියේ මුඛ්‍ය අරමුණ වන රණවිරුවන් සහ රණවිරු පවුල් නගා සිටුවමින් රණවිරු සේවා අධිකාරිය නව දිශානතියකට යොමු කිරීමට අවශ්‍ය පදනම දැමීමට හැකි වී ඇත.

ඊට අමතරව වාර්ෂිකව පවත්වාගෙන එනු ලබන රණවිරු සුභසාධන වැඩසටහන් තව දුරටත් ක්‍රියාත්මක කිරීමට හැකි විය. මෙම කටයුතු සාර්ථක කර ගැනීමට සහය වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, රණවිරු සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලයටත් කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පුද කරමි.



නන්දන සේනාධීර ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වි යූඑස්පි එන්ඩියු
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
සභාපති
රණවිරු සේවා අධිකාරිය

# ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය

## (2019.01.31 දින සිට 2019.05.02 දක්වා)

1. **මේජර් ජෙනරල් (විශ්‍රා) ජේජේපීඑස්ටී ලියනගේ ආර්එස්පී විඑස්වි යූඑස්පි එන්ඩීසී එල්ඩීඑම්සී අයිජී**
   සභාපති, රණවිරු සේවා අධිකාරිය

2. **උපුලාංගනී මාලගමුව මහත්මිය**
   උප සභාපති, රණවිරු සේවා අධිකාරිය

3. **අයි.ටී. වීරසිංහ මෙනවිය**
   අතිරේක ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

4. **වයි.පී. සුමනාවතී මහත්මිය**
   අධ්‍යක්ෂ,ජාතික අයවැය දෙපාර්තමේන්තුව

5. **මේජර් ජෙනරල් එල්.එච්.එස්.සී.සිල්වා**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව

6. **රියර් අද්මිරල් ජේ.ජේ.රණසිංහ**
   මාණ්ඩලික ප්‍රධානී,ශ්‍රී ලංකා නාවික හමුදාව

7. **එයාර් වයිෂ් මාර්ෂල් ඩී.එල්.එස්. ඩයස්**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව

8. **එම්.ඩී. රජිත ශ්‍රී දමින්ද මහතා**
   නියෝජ්‍ය පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය

9. **මේජර් ජෙනරල් ඩී.එම්.ඩී අල්විස්**
   කළමනාකරණ මණ්ඩල සාමාජික

10. **නීතිඥ ආර්.බණ්ඩාර මීගස්වත්ත මහතා**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

11. **ඩබ්.පී.නිමල් ප්‍රනාන්දු මහතා**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

## (2019.05.02 දින සිට 2019.12.11 දක්වා)

1. **මේජර් ජෙනරල් (විශ්‍රා) ජේජේපීඑස්ටී ලියනගේ ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩීසී එල්ඩීඑම්සී අයිජී**
   සභාපති, රණවිරු සේවා අධිකාරිය

2. **නීතිඥ රංජිත් මීගස්වත්ත මහතා**
   උප සභාපති, රණවිරු සේවා අධිකාරිය

3. **අයි.ටී. වීරසිංහ මෙනවිය**
   අතිරේක ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

4. **වයි.පී. සුමනාවතී මහත්මිය**
   අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

5. **මේජර් ජෙනරල් එල්.එච්.එස්.සී.සිල්වා**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව

6. **රියර් අද්මිරල් ජේ.ජේ.රණසිංහ**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා නාවික හමුදාව

7. **එයාර් වයිෂ් මාර්ෂල් ඩී.එල්.එස්. ඩයස්**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව

8. **රන්මල් කොඩිතුවක්කු මහතා**
   නියෝජ්‍ය පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය

9. **මේජර් ජෙනරල් ඩී.එම්.ඩී.අල්විස් (විශ්‍රා)**
   කළමනාකරණ මණ්ඩල සාමාජික

10. **ඩබ්.පී.නිමල් ප්‍රනාන්දු මහතා**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

## (2019.12.12 දින සිට ඉදිරියට)

1. **මේජර් ජෙනරල්(විශ්‍රා) ඩීඑස්එන්කේ සේනාධීර ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වී යූඑස්පි එන්ඩියූ**
   සභාපති, රණවිරු සේවා අධිකාරිය

2. **සෝනියා කෝට්ටේගොඩ මහත්මිය**

   උප සභාපති, රණවිරු සේවා අධිකාරිය

3. **සමන්ති වීරසිංහ මහත්මිය**

   අතිරේක ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

4. **මේජර් ජෙනරල් එස්ඩීටි ලියනගේ**

   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව

5. **රියර් අද්මිරල් නිශාන්ත උළුගේතැන්න**

   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා නාවික හමුදාව

6. **එයාර් වයිස් මාර්ෂල් එස්.කේ. පතිරණ**

   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව

7. **නියෝජ්‍ය පොලිස්පති කමල් සිල්වා මහතා**

   අධ්‍යක්ෂ සුභසාධක(වැ.බ), ශ්‍රී ලංකා පොලීසිය

8. **ප්‍රජීවා අල්විස් මහත්මිය**

   කළමනාකරණ මණ්ඩල සාමාජික

9. **කණිෂ්ක ද සිල්වා මහතා**

   කළමනාකරණ මණ්ඩල සාමාජික

# ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන්

# 01

# ආබාධිත රණවිරුවන් පුනරුත්ථාපනය හා රැක බලා ගැනීම

ක්‍රියාන්විතයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව ආබාධිත තත්ත්වයට පත් වෛද්‍ය වර්ග කිරීම් මත විශ්‍රාම ගන්වන ලද ආබාධිත රණවිරුවන් පුනරුත්ථාපනය හා රැක බලා ගැනීමේ කර්තව්‍ය රණවිරු සේවා අධිකාරිය විසින් ඉටු කරනු ලබයි. එහි දී ආබාධිත රණවිරුවන් කායික, මානසික හා සාමාජයීයව බලගන්වමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට පත්කොට පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාකාරකම් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරයි.

## 1.1 ආබාධිත උපකරණ, සහායක උපකරණ ලබා දීම

සටනේදී අනතුරට ලක් වීම හේතු කොටගෙන තම දෛනික කටයුතු කරගෙන යාමට සහායක උපකරණවල අවශ්‍යතාවය මතුව ඇති රණවිරුවන්ට සහායක උපකරණ ලබා දීමට 2019 වර්ෂයේ දී පහත පරිදි කටයුතු කර ඇත.

| උපකරණය | බස්නාහිර පළාත | නැගෙනහිර පළාත | උතුරුමැද පළාත | සබරගමු පළාත | මධ්‍යම පළාත | දකුණු පළාත | වයඹ පළාත | ඌව පළාත | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| අත්වාරු (යුගල්) | - | - | - | 1 | 1 | 3 | - | - | 5 |
| කිහිලිකරු (යුගල්) | 1 | - | - | - | 2 | - | - | - | 3 |
| රෝද පුටු (සාමාන්‍ය) | 2 | | 4 | 1 | 1 | 1 | 5 | 4 | 18 |
| කෘත්‍රිම පාද | | | | | | | | | |
| මුත්‍රා බෑග් (ප්‍රතිලාභීන්) | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | | | | | | | 34 |

## 1.2. ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය

ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ කායික සෞඛ්‍ය තත්ත්වය සුරක්ෂිතව පවත්වාගෙන යාමට හැකි වන ලෙස සෞඛ්‍යාරක්ෂිත නාන කාමරයක් ඉදි කර ගැනීමට මූල්‍යාධාර ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරයි. ආබාධිත තත්ත්වයට ගැළපෙන නව අංගෝපාංග, උපකරණ හා ආබාධිත පුද්ගලයෙකුට ප්‍රවේශ වීමේ මාර්ග සහිතව නාන කාමරය ඉදි කිරීමට රණවිරුවා දිරි ගැන්වීම මෙහි දී සිදු කරනු ලබයි. 2019 වර්ෂයේ ලබා දුන් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් ප්‍රමාණය |
|---|---|
| කොළඹ | - |
| කළුතර | 1 |
| ගම්පහ | - |
| ගාල්ල | 1 |
| මාතර | - |
| හම්බන්තොට | - |
| මහනුවර | - |
| මාතලේ | 2 |
| නුවරඑළිය | - |
| බදුල්ල | 1 |
| මොණරාගල | 1 |
| කෑගල්ල | - |
| රත්නපුර | 1 |
| කුරුණෑගල | 1 |
| පුත්තලම | - |
| අම්පාර | - |
| ත්‍රිකුණාමලය | - |
| අනුරාධපුර | - |
| පොළොන්නරුව | 3 |
| එකතුව | 11 |




**සනීපාරක්ෂක ආධාර ලබා දීමට පෙර සහ පසු තත්ත්වයන්**




## 1.3. ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු පැවැත්වීම

ආබාධිත තත්ත්වයට පත්වීම හේතු කොටගෙන විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් සිවිල් සමාජගතව තම දෛනික ජීවිතය පවත්වාගෙන යයි. ඔවුන් යුද බිමේ බිහිසුණු ගැටුම්වලට මුහුණ පා අනතුරට ලක්ව ඇත. ඒ හේතු කොටගෙන ඔවුන් විවිධ මානසික සංකූලතාවලට ගොදුරුව ඔවුන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන් ද ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ පා ඇත.

ඔවුන් තනි තනිවත්, පවුල් ලෙසත් හුදෙකලා තත්ත්වයට පත්ව ඇත. මෙම තත්ත්වය මගහරවා රණවිරුවා දිස්ත්‍රික් හෝ පළාත් මට්ටමින් ඒකරාශී කර ඔවුන් දැනුවත් කිරීම මෙන් ම මනෝ සමාජයීයව හා ආධ්‍යාත්මිකව පෝෂණය කිරීම අරමුණු කොට මෙම පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කෙරේ.

දිවයින පුරා ව්‍යාප්තව සිටින කෘත්‍රිම පාද පලඳින රණවිරුවන් ඒකරාශී කර, කෘත්‍රිම පාද භාවිත කිරීමේ නිසි ක්‍රමවේදයන්, කෘත්‍රිම පාද නිෂ්පාදනය කරන නව සැපයුම්කරුවන් හඳුන්වාදීම, කෘත්‍රිම පාද සම්බන්ධයෙන් නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම සහ සේවාලාභීන් දැනුවත් කිරීමේ වැඩමුළු 07 ක් පළාත් මට්ටමින් ක්‍රියාත්මක කර ඇත. 2019 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පළාත | දිස්ත්‍රික්කය | දිනය | ස්ථානය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| ඌව | බදුල්ල<br>මොනරාගල | 2019.09.18 | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය | 23 |
| මධ්‍යම | මහනුවර<br>මාතලේ<br>නුවරඑළිය | 2019.03.06 | මහනුවර පොලිස් ශ්‍රවණාගාරය | 53 |
| දකුණ | ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | 2019.09.11 | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 60 |
| සබරගමුව | රත්නපුර<br>කෑගල්ල | 2019.09.20 | රත්නපුර පළාත් සභා ශ්‍රවණාගාරය | 23 |
| වයඹ | කුරුණෑගල<br>පුත්තලම | 2019.09.04 | කුරුණෑගල රතු කුරුස සංගම් ශාලාව | 47 |
| නැගෙනහිර | අම්පාර<br>ත්‍රිකුණාමලය | 2019.09.20 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 14 |
| උතුරු මැද | අනුරාධපුර<br>පොළොන්නරුව | 2019.09.05 | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 103 |




**ආබාධිත රණවිරුවන්ගේ පුහුණු වැඩමුළුවේ විවිධ අවස්ථා**

## 1.4. ක්‍රීඩා සමාජ ගොඩනැඟීම

යුද ව්‍යසනයට මුහුණ පෑ ආරක්ෂක අංශයන්හි යුද වින්දිතයන් පුනරුත්ථාපන ක්‍රියාවලියෙහි ලා උපයෝගී කරගත හැකි ප්‍රතිඵලදායි ක්‍රියාකාරකම් ලෙස ක්‍රීඩාව හඳුනාගත හැකිය. රණවිරු සේවා අධිකාරිය ක්‍රීඩාව උපයෝගී කර ගනිමින් රණවිරු ප්‍රජාව බල ගැන්වීමේ හා පුනරුත්ථාපන ක්‍රියාවලියේ සාර්ථකත්වයක් අත්පත් කරගෙන ඇත. එකී ප්‍රජාව වෙත තම ක්‍රීඩා කෞශල්‍යයන් වර්ධනය කර ගනිමින් යහපත් කායික හා මානසික සෞඛ්‍යයෙන් හෙබි පිරිසක් බවට පත් කිරීම ක්‍රීඩා අංශයේ මූලික අරමුණ වේ.

**<u>2019 වර්ෂය තුළ දී ක්‍රීඩා අංශය  අත් කරගෙන ඇති ප්‍රගතිය</u>**

| දිනය | ස්ථානය | පවත්වන ලද ඉසව්ව/ කාර්යය |
|---|---|---|
| 2019.09.05 දින සිට 2019.09.06 දක්වා | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගාරය | 2019 පැරා මළල ක්‍රීඩා තරගාවලිය සඳහා ක්‍රීඩකයින් යොමු කිරීම |
| 2019.10.15 දින සිට 2019.10.17 දක්වා | හෙයියන්තුඩුව ජාතික තරුණ සේවා සහා පුහුණු මධ්‍යස්ථානය | වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් අතරින් හිඳි අත්පන්දු (Sitting Volleyball) ක්‍රීඩාවට දක්ෂ ක්‍රීඩකයින් තෝරාගැනීමේ වැඩසටහන හා පුහුණු වැඩමුළුව |
| දිවයින පුරා ව්‍යාප්තව ඇති සංසදවලට අදාළව මෙම ක්‍රීඩා සංචිත පිහිටුවා ඇත. | | සන්නද්ධ හමුදාවල හා පොලිස් සේවයේ නියුක්තව සිට ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගෙන් සමන්විත සංචිතයක් පිහිටුවීම |
| | | වෛද්‍ය හේතූන්මත විශ්‍රාම ගිය රණවිරුවන්ගෙන් සැදුම්ලත් ක්‍රීඩා කණ්ඩායම් හා දුවා දරුවන්ගේ ක්‍රීඩා කණ්ඩායම් පිහිටුවීම |




**හෙයියන්තුඩුව ජාතික තරුණ සේවා සහා පුහුණු මධ්‍යස්ථානයේ පැවති හිඳි අත්පන්දු (Sitting Volleyball) පුහුණු වැඩමුළුව**






**2019 පැරා මලල ක්‍රීඩා තරගාවලිය සඳහා ක්‍රීඩකයින් සහභාගී කරවීම**

| ආබාධිත රණවිරු පසු උවටැන හා පුනරුත්ථාපනය | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| සනීපාරක්ෂක ආධාර සැපයීම | 20 | 11 | 1,000,000.00 | 0.59 |
| ආබාධිත උපකරණ ලබා දීම | 790 | 256 | 1,270,000.00 | 1,460,000.00 |
| ක්‍රීඩා සමාජ ගොඩ නැගීම | 1 | 1 | 0.20 | 0.11 |

# 02

# නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම

ක්‍රියාන්විතයේ දී ආබාධිත රණවිරුවන් සඳහා සහ මියගිය හෝ සොයාගත නොහැකි රණවිරුවන්ගේ යැපෙන්නන්ට රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරි ඇති කර්තව්‍ය යටතේ නිවාස සැපයීම හා එහි ලා සහාය වීම වෙනුවෙන් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

2.1. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය
2.2. නිවාස ණය ලබා දීම
2.3. හදිසි ආපදාවන්හි දී මුල්‍යාධාර ලබා දීම
2.4. ඉඩම් ලබා දීම

## 2.1. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය



නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ රණවිරු සේවා අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන "විරු සුමිතුරු" ජාතික නිවාස ව්‍යාපෘතිය 2016 වර්ෂයෙන් ආරම්භව 2022 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහ ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව, ඒ නිසාම විශ්‍රාම ගන්වන ලද ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම පෙරදැරි කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 5 ක කාලයක් තුළ නිවාස 3650 ක් ඉදි කර අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු.මි. 3192 කි. මෙම මුදල නිවාස සංවර්ධන අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර සුදුසු ප්‍රතිලාභීන් තෝරා නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීම රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරනු ලැබේ.

2019 වර්ෂයේ දී ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් මත තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ රණවිරු සේවා අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලීසිය යන ආයතන නියෝජනය කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් රණවිරු සේවා අධිකාරියේ දී පවත්වන ලදී.

ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීත්වය සඳහා තෝරා ගත් පූර්ණ නිවාස පිළිබඳ සම්පූර්ණ දත්ත පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | 2019 සඳහා තෝරා ගත් පූර්ණ නිවාස | | | | | 2019 සඳහා මූල්‍ය ප්‍රතිලාභ ලබා දුන් පූර්ණ නිවාස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | යුද | නාවික | ගුවන් | පොලිස් | එකතුව | යුද | නාවික | ගුවන් | පොලිස් | එකතුව |
| අනුරාධපුරය | - | - | - | - | - | - | - | - | - | - |
| පොළොන්නරුව | 1 | - | - | - | 1 | 2 | - | - | - | 2 |
| කොළඹ | 4 | - | - | - | 4 | 3 | - | - | - | 3 |
| ගම්පහ | 2 | - | - | - | 2 | 6 | - | - | 2 | 8 |
| කලුතර | - | - | - | - | - | 2 | - | - | - | 2 |
| ගාල්ල | - | - | - | - | - | 1 | - | - | - | 1 |
| මාතර | - | - | - | - | - | | - | - | - | |
| හම්බන්තොට | 3 | - | - | - | 3 | 3 | - | - | - | 3 |
| කෑගල්ල | - | - | - | - | - | 2 | - | - | - | 2 |
| රත්නපුරය | - | - | - | - | - | 2 | - | - | - | 2 |
| මහනුවර | 2 | - | - | - | 2 | 4 | 1 | | 1 | 6 |
| මාතලේ | 3 | - | - | - | 3 | 7 | - | - | - | 7 |
| නුවරඑළිය | 4 | - | - | - | 4 | 2 | - | - | - | 2 |
| කුරුණෑගල | 3 | - | - | - | 3 | 3 | - | - | - | 3 |
| පුත්තලම | 1 | - | - | - | 1 | 2 | - | - | - | 2 |
| බදුල්ල | | - | - | - | | | - | - | - | |
| මොණරාගල | 1 | - | - | - | 1 | 3 | - | - | - | 3 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | 3 | - | - | 2 | 5 |
| අම්පාර | | | | 1 | 1 | 4 | | | 1 | 5 |
| මඩකලපුව | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | - | - |
| එකතුව | 24 | - | - | 1 | 25 | 49 | 1 | - | - | - |

-

* 2018 වර්ෂයේ පූර්ණ නිවාස සඳහා 2019 වර්ෂයේ මුදල් ආධාර ලබා දී ඇත

ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීත්වය සඳහා තෝරා ගත් අර්ධ නිවාස පිළිබඳ සම්පූර්ණ දත්ත පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | 2019 සඳහා තෝරා ගත් අර්ධ නිවාස | | | | | | 2019 සඳහා මූල්‍ය ප්‍රතිලාභ ලබාදුන් අර්ධ නිවාස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | යුද | නාවික | ගුවන් | පොලිස් | සිවිල් ආරක්ෂක | එකතුව | යුද | නාවික | ගුවන් | පොලිස් | සිවිල් ආරක්ෂක | එකතුව |
| අනුරාධපුරය | 150 | 2 | 1 | 19 | - | 172 | 70 | 2 | 1 | 11 | - | 84 |
| පොළොන්නරුව | 25 | - | - | 2 | 1 | 28 | 31 | 2 | - | 3 | 1 | 37 |
| කොළඹ | 24 | 3 | - | 2 | - | 29 | 35 | 1 | 1 | 1 | - | 38 |
| ගම්පහ | 21 | - | - | 1 | - | 22 | 40 | 2 | 3 | 5 | - | 50 |
| කලුතර | 34 | - | - | 5 | - | 39 | 6 | - | 1 | - | - | 7 |
| ගාල්ල | 4 | - | - | - | - | 4 | 29 | 1 | - | 2 | - | 32 |
| මාතර | 16 | - | - | 1 | - | 17 | 41 | - | 1 | 4 | - | 46 |
| හම්බන්තොට | 46 | - | - | 2 | - | 48 | 22 | - | - | 1 | - | 23 |
| කෑගල්ල | 32 | - | 1 | 3 | - | 36 | 32 | 2 | - | - | - | 34 |
| රත්නපුරය | 20 | - | - | 1 | - | 21 | 34 | - | - | 2 | - | 36 |
| මහනුවර | 53 | 6 | - | 9 | - | 68 | 27 | 1 | - | 3 | - | 31 |
| මාතලේ | 55 | 3 | - | 4 | - | 62 | 48 | 2 | 1 | 3 | - | 54 |
| නුවරඑළිය | 46 | - | - | 4 | - | 50 | 17 | - | 1 | 1 | - | 19 |
| කුරුණෑගල | 40 | 1 | - | 5 | - | 46 | 15 | - | - | 3 | - | 18 |
| පුත්තලම | 10 | - | - | 2 | - | 12 | 9 | - | - | 1 | - | 10 |
| බදුල්ල | 13 | - | - | 1 | - | 14 | - | - | - | - | - | 0 |
| මොණරාගල | 7 | 1 | - | 1 | - | 9 | 7 | - | - | 1 | - | 8 |
| ත්‍රිකුණාමලය | 12 | 1 | 2 | 5 | - | 20 | 32 | - | 1 | 7 | - | 40 |
| අම්පාර | 34 | 1 | - | 6 | - | 41 | 36 | - | - | 5 | - | 41 |
| මඩකලපුව | | - | - | - | - | 0 | - | - | - | - | - | 0 |
| වව්නියාව | 1 | - | - | - | - | 1 | - | - | - | - | - | 0 |
| එකතුව | 643 | 18 | 4 | 73 | 1 | 739 | 531 | 13 | 10 | 53 | 1 | 608 |

2019 වර්ෂයේ අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කළ පූර්ණ නිවාස සංඛ්‍යාව දිස්ත්‍රික් අනුව පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | පූර්ණ නිවාස | | | | |
|---|---|---|---|---|---|
| | යුද | නාවික | ගුවන් | පොලිස් | එකතුව |
| අනුරාධපුරය | 2 | - | - | - | 2 |
| අම්පාර | 4 | - | - | - | 4 |
| කලුතර | 1 | - | - | - | 1 |
| කොළඹ | 5 | - | - | - | 5 |
| බදුල්ල | 2 | - | - | - | 2 |
| මහනුවර | 2 | - | - | - | 2 |
| කෑගල්ල | 1 | - | - | - | 1 |
| මාතර | 1 | - | - | - | 1 |
| ගාල්ල | 2 | - | - | - | 2 |
| පුත්තලම | 5 | - | - | - | 5 |
| මාතලේ | 5 | - | - | - | 5 |
| එකතුව | 30 | - | - | - | 30 |

2019 වර්ෂයේ දී දිවි පිදූ රණවිරුවන් සඳහා ලබා දුන් පූර්ණ නිවාස සංඛ්‍යාව - 09

2019 වර්ෂයේ දී ආබාධිත රණවිරුවන් සඳහා ලබා දුන් පූර්ණ නිවාස සංඛ්‍යාව - 21

## 2.2. නිවාස ණය ලබා දීම



රණවිරු සංසද හා රණවිරු ගම්මානවල සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කරමින් මෙතෙක් නිමකර ගැනීමට නොහැකි වූ නිවාසවල වැඩ නිමකර ගැනීම සඳහා සහය වීම අරමුණු කර ගනිමින් නිවාස ණය ලබා දීම සිදු කෙරේ.

මෙමගින් රු. 800,000.00 ක ණය මුදලක් ලබා දෙන අතර එය වාරික 02 ක් ලෙස ලබා දීම සිදු කරයි. ණය අය කර ගැනීමේ කාලය උපරිම වසර 05 ක් වන අතර 5% ක සේවා ගාස්තුවක් මත මෙම ණය මුදල ලබා දීම සිදු කරයි.

2019 වර්ෂයේ නිවාස ණය පළමු වාරික 79 දෙනෙකු සඳහා ද, නිවාස ණය දෙවන වාරික 46 දෙනෙකු සඳහා ද ලබා දී ඇත.





**නිවාස ණය වැඩසටහනට අදාළව මෑතකදී ලබාගත් ඡායාරූප**

## 2.3. හදිසි ආපදාවන්හි දී මූල්‍යාධාර ලබා දීම

රණවිරු සංසද සාමාජිකත්වය දරන දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට හා ආබාධිත රණවිරුවන්ට මුහුණ දීමට සිදු වන නාය යෑම්, සුළි සුළං, ගිනි ගැනීම් හා ජල ගැලීම් වැනි ස්වභාවික ආපදා තත්ත්වයන්වලදී ඔවුන්ට සිදුවන දේපල හානි සැලකිල්ලට ගනිමින් එම රණවිරු පවුල් වෙත අස්වැසිල්ලක් වන අරමුණෙන් උපරිමය රු. 50,000.00 ක මුදලක් කඩිනමින් ලබා දී රණවිරු පවුල් වෙත මූල්‍ය සහනයක් ලබා දීම මෙමගින් සිදු කරයි.

## 2.4. ඉඩම් ලබා දීම

රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය රණවිරුවන් හා එම පවුල් සඳහා ඉටු කිරිමේදී ප්‍රධාන ගැටලුවක් වන්නේ එම පවුල් සඳහා වාසස්ථානයක් සපයා දීම ය. එහෙත් බොහෝ විට නිවාස හා සහන ණය ව්‍යාපෘතීන් මාර්ගයෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා පදිංචියට නිවසක් සඳහා දිරි දුන්න ද, එම නිවාස ගොඩනැගීම සඳහා ස්ථානයක් (ඉඩමක්) හිමිව නැති අවස්ථාවන්වල දී රණවිරුවා හා එම පවුල් මහත් අසීරුතාවයකට පත් වේ.

එයට විසඳුමක් ලෙස ඉඩම් ව්‍යාපෘතිය මගින් ඍජුවම ඉඩම් කැබලි ලබා දීම හා ඉඩම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සිදු කෙරේ. ඒ අනුව පහත පරිදි 2019 වර්ෂයේ ඉඩම් ව්‍යාපෘතියේ ප්‍රගතිය දැක්විය හැකි ය.

**2019 වසරේ ඉඩම් කොටස් ලබා දීම**

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| ඉඩම් කොටස් ලබා දීම | 67 |
| ඉඩම් කච්චේරි පැවැත්වීම | 03 |
| රණවිරුවන්ගේ ඉල්ලීම්වලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් යොමු කර ඇති ලිපිවලට අදාළව පදිංචි වී ඇති ඉඩම් සඳහා ඔප්පු /බලපත්‍ර ලබා ගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම | 154 |
| හඳුනාගත් ඉඩම් සඳහා නාම ලේඛන ඉදිරිපත් කිරීම (නිවාස සංවර්ධන අධිකාරිය, මහවැලි අධිකාරිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත) | 286 |

**වැය ශීර්ෂය - පරිපාලන වියදම් 2019 වර්ෂය**

| විස්තරය | මුදල (රු) |
|---|---|
| රණවිරුවන් වෙත ලබා දී ඇති ඉඩම් සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැවැති රැස්වීම්වලට සහභාගී වීම (ඉඩම් නිරීක්ෂණය සඳහා) | 2865.00 |

| නිවාස සැපයීම සහ නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය (පූර්ණ නිවාස) | 488 | 38 | | |
| විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය (අර්ධ නිවාස) | 425 | 741 | 0.5 | 0.05 |
| නිවාස ණය ලබා දීම | 100 | 79 | 42 | 38.4 |
| ඉඩම් කොටස් ලබා දීම | ඉල්ලීම් පරිදි අදාළ ආයතන වෙත යොමු කෙරේ. | 67 | ප්‍රතිපාදන වැය නොවේ. | |
| ඉඩම් කච්චේරි පැවැත්වීම | | 3 | | |
| ඔප්පු /බලපත්‍ර ලබා ගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම | | 154 | | |
| හඳුනාගත් ඉඩම් සඳහා නාම ලේඛන ඉදිරිපත් කිරීම | | 286 | | |

# 3

# වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම

ආබාධිත රණවිරුවන්, ඔවුන්ගේ පවුල්වල ළඟම ඥාතීන් හා දිවි පිදූ, අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යක් ලෙස වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම යන කරුණ සඳහන් කළ හැකි ය. ඒ අනුව එය ඉටු කිරීම සඳහා පහත ව්‍යාපෘති හා වැඩසටහන් රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරනු ලබයි.

## 3.1. වෛද්‍යාධාර ලබා දීම

ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත විශ්‍රාමික තත්ත්වයට පත්ව රෝගාබාධයන්ට ලක් වූ රණවිරුවන්, ඔවුන්ගේ පවුල්වල ළඟම ඥාතීන් සහ දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා සහාය වීම මෙම වැඩසටහන වෙතින් සිදු කෙරේ.

මේ යටතේ හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහාය වීම, රෝග තත්ත්වයන් මගහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබා දීම, ආර්ථික අපහසුතා ඇති රෝගයන්ගෙන් පෙළෙන ඉල්ලුම්කරුවන්ට ප්‍රතිකාර ගැනීම සඳහා සහාය වීම මෙමගින් සිදු කරයි.

ඒ අනුව, 2019 වර්ෂයේදී ප්‍රතිලාභ ලබා දීම මෙසේ ය.

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් ප්‍රමාණය | | එකතුව |
|---|---|---|---|
| | පැරණි ප්‍රතිලාභීන් | නව ප්‍රතිලාභීන් (2019) | |
| කොළඹ | 10 | 7 | 17 |
| ගම්පහ | 7 | 1 | 8 |
| කළුතර | 7 | - | 7 |
| මාතලේ | 7 | 2 | 9 |
| මහනුවර | 10 | 2 | 12 |
| කෑගල්ල | 1 | 2 | 3 |
| බදුල්ල | 2 | 2 | 4 |
| රත්නපුර | 4 | 1 | 5 |
| කුරුණෑගල | 2 | 2 | 4 |
| අනුරාධපුරය | 4 | 3 | 7 |
| නුවරඑළිය | 3 | 2 | 5 |
| අම්පාර | 2 | - | 2 |
| පුත්තලම | 2 | - | 2 |
| පොළොන්නරුව | 2 | - | 2 |
| ගාල්ල | 4 | - | 4 |
| මාතර | 4 | 1 | 5 |
| එකතුව | 71 | 25 | 96 |




## 3.2. වෛද්‍ය සහන ණය

රණවිරු ප්‍රජාව මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු පදනම් කරගෙන වාර්ෂිකව විශාල පිරිසක් වෛද්‍ය ආධාර අයදුම් කරයි. හදිසි සැත්කම් හා ප්‍රතිකාරයන් සඳහා බහුතරයක් ඉල්ලීම් යොමු කරන අතර මින් වැඩි පිරිසක් වැටුප් හා දීමනා ලබන පුද්ගලයන් වේ.

වෛද්‍ය නිර්දේශය මත හදිසි මූල්‍යාධාර අවශ්‍ය රණවිරු ප්‍රජාව වෙනුවෙන් පොලී රහිත ණය මුදලක් ලබා දීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. එබැවින් මීට ඉහත දී ක්‍රියාත්මක වූ මූල්‍ය ප්‍රතිපාදන හිඟතාවය මත අත්හිටුවා තිබුණු වෛද්‍ය සහන ණය වැඩසටහන 2019.10.17 දින සිට නැවත ක්‍රියාත්මක විය.

ඒ අනුව 2019 වසර අවසානය වන විට ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත වෛද්‍ය සහන ණය ලබා දී ඇත.

| වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| වෛද්‍ය ආධාර | ඉල්ලීම් පරිදි | 96 (නව ප්‍රතිලාභීන් 25 ක් හා පැරණි ප්‍රතිලාභීන් 71) | 3,000,000.00 | 2,710,600.00 |
| වෛද්‍ය ණය | ඉල්ලීම් පරිදි | 4 | 1,000,000.00 | - |

# 4

# අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යයන් යටතේ අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාවක් සැලසීම වෙනුවෙන් විවිධ වූ ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ රණවිරු සේවා අධිකාරිය මගින් ශිෂ්‍යාධාර පිරිනමනු ලබයි.

4.1. රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව
4.2. අ.පො.ස (උ/පෙළ) ශිෂ්‍යත්ව
4.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර
4.4. මාපිය කැපකරු ශිෂ්‍යත්ව
4.5. කුසලතා ප්‍රවර්ධන ආධාර
4.6. කුසලතා සංවර්ධන ණය

## 4.1. රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව

ක්‍රියාන්විත සේවයේ නියුතුව සිය ජීවිතය පූජා කරන ලද, ආබාධිත විශ්‍රාමික වූ හා දැනට ආබාධිතව සේවයේ නියුතු රණවිරුවන්ගේ දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා 2005 වසරේ සිට ආරම්භ කරන ලද රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව වැඩසටහන ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග එක්ව 6 වසරේ සිට අ.පො.ස (සා/පෙළ) දක්වා අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. මෙම දරුවන්ගේ අ.පො.ස(සා/පෙළ) , (උ/පෙළ) අධ්‍යාපන සඳහා රුපියල් 12,000/- ක ඉතුරුම් මුදලක් ලැබෙන පරිදි මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ.

2019 වර්ෂයේදී රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ නව ශිෂ්‍යත්ව 461 ක් ලබා දී ඇත. පැවති ගිණුම් ශිෂ්‍යත්ව 950 කට ද සඳහා මුදල් බැර කර ඇත.

## 4.2. අ.පො.ස (උ/පෙළ) ශිෂ්‍යත්ව

අ.පො.ස(උ/පෙළ) අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම ශිෂ්‍යත්ව ක්‍රමයේ දී 4.1 යටතේ සඳහන් කළ රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්වලාභියෙකු නොවූ දරුවෙකු සඳහා අ.පො.ස(සා/පෙළ) හොඳින් සමත් වී අ.පො.ස (උ/පෙළ) හදාරන අවස්ථාවේදී මසකට රු. 500 බැගින් උපරිම වසර දෙකක් දක්වා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම සිදු කරයි.

මෙහි ප්‍රතිලාභීන්, ක්‍රියාන්විත සේවයේ යෙදී සිට දිවි පිදූ, ආබාධිත විශ්‍රාමික හා දැනට ආබාධිතව සේවයේ නියුතු රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් වන අතර, 2019 වර්ෂයේ දී දරුවන් 230 ක් සඳහා ආධාර මුදල් ලබා දී ඇත. පැවති ගිණුම් 332 ක් සඳහා මුදල් බැර කර ඇත.

## 4.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

මෙම ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ අ.පො.ස(උ/පෙළ) සමත්වී එහි ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය සඳහා වරම් ලබන දරුවන්ට මසකට රු. 2000 බැගින් ඔවුන්ගේ අධ්‍යයන කාලය තුළ ඉදිරියට අධ්‍යයන වර්ෂ 4ක් ඇතුළත් වන සේ උපරිම වාරික 40 ක් දක්වා මෙම ශිෂ්‍යාධාර මුදල පිරිනමනු ලැබේ.

2019 වර්ෂයේ දී උසස් අධ්‍යාපනය ලබන දරුවන් 103 දෙනෙකු සඳහා නව ශිෂ්‍යාධාර ලබා දීම සිදු කර ඇත. පැවති ගිණුම් 197 ක් සඳහා මුදල් බැර කර ඇත.

## 4.4. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ගේ අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරුවන්, සියලුම රණවිරුවන්ගේ විශේෂ අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරුවන් සහ දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබාගත යුතු රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන රණවිරුවන්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව නිසියාකාරව සිදු කර ගෙන යාමට අත්වැලක් සැපයීම සඳහා මෙම ශිෂ්‍යාධාර පිරිනමනු ලබයි.

ඒ අනුව, එම දරුවන් අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වන තෙක් මාසිකව මෙම මාපිය කැපකරු ශිෂ්‍යාධාර මුදල් පිරිනමනු ලබන අතර, එය අධිකාරියේ මුදල් යෙදවීම මත හා පරිත්‍යාගශීලීන්ගේ මූල්‍යමය දායකත්වයන් මත ලබා දෙයි.

පළමුව අධිකාරියේ මුදල් යෙදවීම මත රු.500 ක මුදලක් ලබා දෙනු ලබන අතර, එම කාලය අතරතුර කැපකරු මාපියන් ලෙසින් දරුවන්ගේ අධ්‍යාපනයට අතහිත දීමට බලාපොරොත්තු වන පරිත්‍යාගශීලීන්ගේ ආධාර මුදල් දරුවන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂයේ දී මා පිය කැපකරු ශිෂ්‍යත්ව දරුවන් 337 දෙනෙකු වෙත ලබා දී තිබේ.

## 4.5. කුසලතා ප්‍රවර්ධන ණය

දේශීය හා විදේශීය උසස් අධ්‍යාපන ආයතන වෙතින් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා රණවිරු දරුවන් දිරි ගන්වමින්, සහනදායී සේවා ගාස්තුවක් යටතේ උපරිමය රු.500,000.00 ක මුදලක් මෙම ණය ක්‍රමය යටතේ ලබා දීම සිදු කරයි. ඒ අනුව මෙම ණය ක්‍රමය යටතේ 2019 වර්ෂය තුළ ප්‍රතිලාභීන් 04 දෙනෙකු සඳහා ණය මුදල් ලබා දී ඇත.

| අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| රණවිරු දූදරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව (6,7,8,9 ශ්‍රේණි සඳහා) | 1100 | 1411 | 15,830,000.00 | 14,685,000.00 |
| අපොස. (සා/පෙළ) , (උ/පෙළ) ශිෂ්‍යත්ව | 600 | 562 | | |
| උසස් අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යාධාර | 292 | 300 | | |
| මා පිය කැපකරු ශිෂ්‍යත්ව ආධාර | 750 | 337 | 4,200,000.00 | 3,403,000.00 |
| කුසලතා ප්‍රවර්ධන ණය | 4 | 4 | 1,500,000.00 | 595,000.00 |

# 05

# ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යයන් යටතේ ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම සඳහා රණවිරු ප්‍රජාව වෙනුවෙන් පහත ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

5.1. ස්වයං රැකියා ණය ලබා දීම
5.2. ව්‍යවසාය සංවර්ධන වැඩමුළු පැවැත්වීම

## 5.1. ස්වයං රැකියා ණය ලබා දීම.

රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සහජ දක්ෂතා පදනම්ව පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් කාර්මික හා තාක්ෂණික පුහුණුව සඳහා මග පෙන්වීම සහ අවස්ථා සලසාදීම මෙන් ම රැකියාවලට යොමු කිරීම, ස්වයං රැකියා සඳහා දිරිමත් කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

රණවිරු ප්‍රජාවට ස්වයං රැකියා ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම යටතේ වාර්ෂිකව 5% ක සේවා ගාස්තුවක් පමණක් අයකර රු.500,000.00 ක ණය මුදලක් ලබා දෙයි.

ඒ අනුව, 2019 වර්ෂයේ ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් ස්වයං රැකියා ණය 34 ක් ලබා දී ඇත.

## 5.2. ව්‍යවසාය සංවර්ධන වැඩමුළු පැවැත්වීම

රණවිරු ප්‍රජාව ස්වයං රැකියා සඳහා පෙළඹවීම, යොමු කරවීම, වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණය හා පුහුණුව ලබා දීම සඳහා වැඩමුළු පවත්වනු ලැබේ. ඒ අනුව, 2019 වර්ෂයේ දී ව්‍යාපාර අවස්ථාවලට පෙළඹවීමේ මූලික පුහුණු වැඩමුළුවක් පවත්වා ඇත.

| ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| ස්වයං රැකියා ණය ලබා දීම | 25 | 34 | 10,890,000.00 | 8,990,000.00 |
| ව්‍යවසාය සංවර්ධන වැඩමුළු පැවැත්වීම | අවශ්‍යතාවය මත වැඩමුළු පවත්වනු ලැබේ | 1 | - | - |

# 6

# අධිකාරියේ කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම යටතේ පහත සඳහන් ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

6.1. රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන
6.2. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ
6.3. රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරීම
6.4. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය
6.5. මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු
6.6. යාකබැද්ද - රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය
6.7. "විරුසර" වරප්‍රසාද කාඩ්පත
6.8. කාන්තා පවුර රණවිරු උපදේශන ජාලය ගොඩ නැගීමේ වැඩසටහන
6.9. රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ව්‍යාපෘති

## 6.1. රණවිරු මාපිය සුරැකුම වැඩසටහන

ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත 2007 වසරේ නොවැම්බර් මස 21 වන දින සිට රණවිරුවාගේ වැටුපෙන් 25% ක මුදලක් ගෙවීම සිදු කරනු ලබයි. එහෙත් ඉහත කාල සීමාවට පෙර මියගිය විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන්ට කිසිදු දීමනාවක් නොලැබෙන අතර, එම දෙමව්පියන්ට කෘතගුණ සැලකීමක් වශයෙන් රජයේ විශ්‍රාමික වැටුප් නොලබන රණවිරු දෙමව්පියන් වෙත රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන යටතේ මූල්‍යාධාර පිරිනමනු ලබයි.

මෙම ප්‍රතිලාභයට දායක වන සෑම දෙමාපියෙකුටම රණවිරු සේවා අධිකාරිය මගින් ජාතික ඉතිරි කිරිමේ බැංකුවේ තැපැල් බැංකු ශාඛා ගිණුම් ආරම්භ කරනු ලබන අතර, දෙමව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් සිටී නම් මාසිකව රු. 2,250.00 බැගින් ද, දෙමව්පියන් දෙදෙනාම සිටී නම් එක් අයෙකු සඳහා මාසිකව රු. 1,500.00 බැගින් රු. 3,000.00 ක මුදලක් ලබා දීම සිදු කරන අතර මුදල් ලබා ගැනීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කාර්යාල මගින් සිදු කර ගැනීමට හැකිය.

සෑම මසකම අවසානයේ ගිණුම්වලට මුදල් බැර කරන අතර ගිණුමේ මුදල ඉතිරි නොකර අදාළ මස මුදල ලබා ගන්නා ලෙස ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. ගිණුම් හිමියා මිය ගිය විට මරණ සහතිකය හා ගිණුම් පොත ඉදිරිපත් කළ පසු ගිණුමේ මුදල් රණවිරු සේවා අධිකාරියේ ගිණුමට බැර වේ. ගිණුමෙන් මුදල් ලබා ගත හැකි වන්නේ අදාළ ප්‍රතිලාභියාට පමණක් වන අතර දෙමාපියන් දෙදෙනාම ජීවත්ව සිටින විට එක් අයෙකු මිය ගිය බව දැනුම් දුන් පසු ජීවත්ව සිටින ප්‍රතිලාභියාට මාසිකව ගෙවන මුදල රු.2250 ක් දක්වා වැඩි කරනු ලබයි.

## 6.2. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභය

යුද්ධයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවි පිදූ, අතුරුදහන් හා ආබාධිත තත්ත්වයට පත්ව වෛද්‍ය හේතුන් මත විශ්‍රාමිකව සිටින (රණවිරු සේවා අධිකාරියේ පනත යටතට ගැනෙන) රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන් වෙත ගෙවනු ලබන මාපිය රැකවරණ දීමනාව (රු.750.00) මසකට වරක් ලබා දීම රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙතින් සිදු කරනු ලබයි. මෙම දීමනාව සඳහා මුදල් බැර කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන රාජ්‍ය බැංකුවලින් නිකුත් කරනු ලබන මාපිය රැකවරණ ගිණුම් සඳහා පමණි.

පවුලක රණවිරු සාමාජිකයින් කිහිප දෙනෙකු සිටිය ද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රු 750 ක් බැගිනි. යම් පවුලක මියගිය රණවිරුවෙකු සහ ජීවත්වන ආබාධිත රණවිරුවෙකු හෝ දැනට සේවයේ නියුතු රණවිරුවෙකු සිටී නම්, දිවි පිදූ රණවිරුවා වෙනුවෙන් දීමනාව ගෙවනු ලැබේ. මව, පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වන අතර කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක. මව පියා මියගිය වහාම අදාළ බැංකුව වෙත පාස් පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත අදාළ මරණයට පත් අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

දීමනාලාභියා වෙනුවෙන් මාස 06 කට වරක්, සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර ජීවත්ව සිටින බවට සහතිකයක් ග්‍රාම සේවා නිලධාරී විසින් සහතික කර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ.

## 6.3. රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරීම

දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ ළඟම ඥාතීන් අතර අන්‍යෝන්‍ය සහසම්බන්ධතාව ගොඩනැංවීම තුළින් එම පවුල්වල මනෝ සමාජයීය සංවර්ධනය හා රණවිරු නාමය සදානුස්මරණය කිරීම උදෙසා රණවිරු සේවා අධිකාරියට අයත් නිල සන්නිවේදන ජාලය වන්නේ "රණවිරු සංසද" වේ.

රණවිරු සංසද පරිපාලනය සඳහා රණවිරු සංසද ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කර ඇත. රණවිරු සංසද 273 ක් දැනට පවත්වාගෙන යන අතර දිස්ත්‍රික් මට්ටමින් සංසද නිලධාරින් දැනුවත් කරමින් වැඩසටහන් පැවැත්වීම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් මාර්ගයෙන් සිදු කරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂයේ දිස්ත්‍රික් දැනුවත් කිරීම් 20 ක් පවත්වා ඇත.

## 6.4. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය



රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම හා හිතකර සියලු ක්‍රියා හා දේ යටතේ තම මාතෘභූමියේ චිරස්ථිතිය උදෙසා තම ජීවිතය මාතෘභූමිය මත පූජා කළ හා තම ශරීරාංග කැප කළ වීර වික්‍රමාන්විත රණවිරුවාගේ නාමය අඛණ්ඩව සුරක්ෂිත කිරීම හා ඔවුන්ගේ සුභසාධන අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාත්මක වීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි. ඒ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරයි.

### ජාතික රණවිරු දින සැමරුම් උත්සවය

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා රටේ ඒකීයභාවය, ස්වෛරීත්වය හා සියලු ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් තම උත්තරීතර ජීවිතය මාතෘභූමිය වෙනුවෙන් පූජා කළ වීර වික්‍රමාන්විත රණවිරු නාමය අනුස්මරණය කරනු වස් ජාතියේ අභිමානවත් ගෞරවය පුද කිරීම සඳහා ජාතික හා පළාත් මට්ටමින් රණවිරු සැමරුම් උත්සව 2001 වසරේ සිට මේ දක්වා පවත්වනු ලබයි.

2019 වර්ෂයේ ජාතික රණවිරු සැමරුම් උත්සවය බත්තරමුල්ල පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේ ජාතික රණවිරු සැමරුම් උද්‍යානයේ රණවිරු ස්මාරකය අබියස දී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2019.05.19 වන දින අභිමානවත් ලෙස පවත්වන ලදී.

### පළාත් රණවිරු සැමරුම් උත්සව

වීරෝදාර රණවිරුවන් හා ඥාතීන්, පළාත් මට්ටමින් ඒකරාශී කරමින් ආණ්ඩුකාරවරුන් ප්‍රධාන පළාත් සභා මැති ඇමතිවරුන්ගේ හා පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පළාත් රණවිරු සැමරුම් උත්සව පැවැත්වේ.

ඒ අනුව, 2019 වර්ෂයේ පළාත් රණවිරු සැමරුම් උත්සව පැවැත්වූ ස්ථාන පහත පරිදි වේ.

| පළාත | පැවැත් වූ ස්ථානය |
|---|---|
| මධ්‍යම පළාත | මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ දී |
| වයඹ පළාත | මාලිගාපිටිය ක්‍රීඩාංගනය අසල රණවිරු ස්මාරකය අබියසදී |
| උතුරු මැද පළාත | අනුරාධපුර රණවිරු ස්මාරකය අබියස දී |
| උතුරු පළාත | ආරක්ෂක සේනා මූලස්ථානය - පලාලි |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය කොටුව රණවිරු ස්මාරකය අබියස දී |
| ඌව පළාත | බදුල්ල රණවිරු ස්මාරකය අබියස දී |
| සබරගමුව පළාත | රත්නපුර නව නගරය රණවිරු ස්මාරකය අබියස දී |
| දකුණු පළාත | ගාල්ල පොලිස් ස්ථානය අබියස දී |

## 6.5. මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමේ දී දිවි පිදූ රණවිරුවන් සිහි කරලීම සඳහා ඉදි වූ ශ්‍රී ලංකාවේ පළමු ජාතික රණවිරු අනුස්මරණ උද්‍යානය මෙය වේ. ආකර්ෂණීය භූමි භාගයක පවත්වා ගෙන යනු ලබන මයිලපිටිය රණවිරු සැමරුම් උද්‍යානය තුළ, දිවි පිදූ සියලුම රණවිරුවන්ගේ නාමයන් ශෛලමය පුවරු මත ප්‍රතිෂ්ඨාපනය කර, රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් සහිතව රණවිරු අනුස්මරණ උද්‍යානයක් ඉදි කර ඇත. 2003 වර්ෂයේ දී ජාතික රණවිරු අනුස්මරණ ජාතික උත්සවය මෙම ස්ථානයේ දී පවත්වන ලදී.

මෙම උද්‍යානයේ ජලය, විදුලිය හා නඩත්තු සඳහා වැය දැරීම් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර ආරක්ෂාව හා නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ සහයෝගය ලබා දීම සිදු කරනු ලැබේ.

## 6.6. යාකබැද්ද - රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය



මාතෘභූමිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ රණවිරුවන්ගේ (විවාහක/අවිවාහක) පිළිසරණක් නොමැති අසරණභාවයට පත් දෙමාපියන් පිළිබඳ තොරතුරු වාර්තා වී ඇති අතර, ඉන් සමහර දෙමාපියන් තම එකම දරුවා යුද්ධයේ දී ජීවිතය පූජා කළ බැවින් තම වයෝවෘද්ධ ජීවිතයට පිළිසරණක් නොමැති සමාජ රැකවරණය අවශ්‍ය තත්ත්වයට පත්ව ඇත.

ඒ අනුව කමනි රත්නායක, මහින්ද රත්නායක, ඥානානන්ද රත්නායක ඇතුළු පවුලේ ඥාතීන් විසින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ ඇති ඉඩමක පිහිටි ගොඩනැගිල්ල **" රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය "** නමින් සංවර්ධනය කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

## 6.7. "විරුසර" වරප්‍රසාද කාඩ්පත




පුරා දශක තුනකට අධික කාලයක් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට එරෙහිව පැවති යුද්ධයේ දී තම ජීවිත හා ශරීරාංග රට වෙනුවෙන් පූජා කරමින් යුද්ධය නිම කිරීම සඳහා සාධනීය අමිල දායකත්වයක් සපයා දෙන ලද යුද, නාවික, ගුවන් ,පොලිස් හා සිවිල් ආරක්ෂක සේවයේ රණවිරුවන් සිදු කරන ලද අමිල කැප කිරීමට කෘතගුණ සැලකීමක් වශයෙන් අතිගරු ජනපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආශීර්වාදයෙන් හා ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමාගේ සංකල්පනාවෙන් "විරුසර වරප්‍රසාද කාඩ්පත" බිහි විය. මෙම විරුසර වරප්‍රසාද කාඩ්පත අදියරයන් දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

**පළමු අදියර -** ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තුමේන්තුව හා සිවිල් ආරක්ෂක බලකායේ සේවය කරමින් ක්‍රියාන්විතයේ දී ජීවිත පරිත්‍යාග කළ සහ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙත හා ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් සඳහා

**දෙවන අදියර -** යුදමය කාල සීමාව තුළ එනම් 1983 සිට 2009 දක්වා ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක බලකාය තුළ යහපත් පැවැත්මෙන් සේවය කර 2009 වන විට නිලධාරීන් සඳහා නියමිත වසර 20 ක, සෙසු නිලයන් සඳහා නියමිත වසර 22 ක හෝ කාන්තා නිලධාරී/ සෙසු නිලයන් සඳහා නියමිත වසර 15 ක සේවා කාලය සපුරා දැනට විශ්‍රාම ගොස් සිටින හෝ තවදුරටත් සේවයේ යෙදී සිටින රණවිරුවන් සඳහා

මෙම ව්‍යාපෘතිය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය, රණවිරු සේවා අධිකාරිය සමග සම්බන්ධ වී 2016 ජනවාරි 25 දින සිට ක්‍රියාත්මක වේ. මේ වන විටත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන 68 කට අධික සංඛ්‍යාවක් මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වෙමින් රණවිරු කුටුම්බයන් වෙත ප්‍රතිලාභ සලසමින් පවතී. මෙමගින් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව ආසන්න වශයෙන් 120,000 ක් පමණ වේ. ඒ අනුව පහත සඳහන් පරිදි ප්‍රතිලාභ ලබා දෙන ආයතන වර්ග කර දැක්විය හැකිය.

- බැංකු
- මූල්‍ය හා කල්බදු
- රක්ෂණ
- සන්නිවේදන
- අධ්‍යාපන හා වෘත්තීය පුහුණු
- සෞඛ්‍යය
- ප්‍රවාහන
- පාරිභෝගික සැපයුම්

ඒ අනුව 2019.12.31 දිනට විරුසර වරප්‍රසාද කාඩ්පත් 42953 ක ප්‍රමාණයක් නිකුත් කර ඇත.

## 6.8. කාන්තා පවුර රණවිරු උපදේශන ජාලය ගොඩනැගීමේ වැඩසටහන

රණවිරු කාන්තාවන්ගේ මානසික තත්ත්වය හා සමාජයීය, ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගැනීමේදී ප්‍රජාවේ අනෙකුත් කාන්තාවන්ට වඩා සුවිශේෂී වූ ලෙස ඔවුන් වෙන් කොට හඳුනාගත හැකිය.

කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් කාන්තාවන්ට අවශ්‍ය කරන මාර්ගෝපදේශනය, සම්බන්ධීකරණය මෙන්ම මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර සැපයීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ආයතන හා ඒ හා සබැඳි නිලධාරීන් රැසක් රාජ්‍ය හා රාජ්‍ය නොවන මට්ටමින් දිවයින පුරා ක්‍රියාත්මකය.

එම නිසා විරු කාන්තාවන්ට ඔවුන්ගේ ගැටලු විසඳා ගැනීමට මෙන්ම දැනුම, අවබෝධය, පුළුල් කර ගැනීමට අවශ්‍ය මගපෙන්වීම ලබා ගත හැකි ආයතන හා ඒ හා සබැඳි නිලධාරීන් පිළිබඳව දැනුවත් කිරීම ඉතා වැදගත්ය. තවත් ලෙසකින් විරු කාන්තාවන්ගේ මානසික, සාමාජයීය, ආර්ථික පසුබිම පිළිබඳව පූර්ව අවබෝධයක් සහිතව අදාළ මාර්ගෝපදේශන හා සහායක ක්‍රියාදාමයන් එකී නිලධාරින් ක්‍රියාත්මක කරන්නේ නම් වඩා අවබෝධාත්මක, ගුණාත්මක සේවාවන් ලබා දිය හැකිය. මෙය දෙපාර්ශවයටම වඩා වාසිදායක ක්‍රියාවලියකි.

එසේ හෙයින් කාන්තා පවුර - සවිබලකරණ වැඩසටහන තුළින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කාන්තා අභිවෘද්ධි ක්‍රියාවන්හි නිරතවන රාජ්‍ය ආයතන හඳුනාගෙන ඔවුන් රණවිරු කාන්තා ගැටලු කෙරෙහි සවිඥානික කිරීම තුළින් වඩා ප්‍රායෝගික සේවාවන් රැසක් රණවිරු කාන්තා ප්‍රජාව කෙරෙහි ළඟා කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව 2019 වසරේ කාන්තා පවුර වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කරන ලදී.





**කාන්තා පවුර වැඩසහනේ විශේෂ අවස්ථා**

## 6.9. "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන

දශක තුනකට ආසන්න කාලයක් රට තුළ පැවති යුද ගැටුම්වලට සෘජුවම හා වක්‍රව මුහුණ පෑ ආරක්ෂක අංශ සාමාජික සාමාජිකාවන් හට බලපා ඇති මානසික සමාජයීය හා ආධ්‍යාත්මික ගැටලු සඳහා විසඳුම් රණවිරු ප්‍රජාව වෙතින්ම ලබා ගැනීමට හැකිවන පරිදි රණවිරු ප්‍රජාවගේ විඥානය පුබුදු කිරීමේ වැඩසටහනක් ලෙස **"රණවිරු සිත් සුවය"** වැඩසටහන හැඳින්විය හැකිය.

කොළඹ 07, විජේරාම මාවත පිහිටි ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති ගෞරවනීය පූජ්‍යපාද උඩුදුම්බර කාශ්‍යප මාහිමිපාණන් වහන්සේගේ මග පෙන්වීමෙන් යුතුව විපස්සනා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය හා එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

| අනු අංකය | වැඩසටහන | පැවැත්වූ දිනය | ඉලක්ක කණ්ඩායම | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර පළාත් "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 2019.02.11 | රණවිරු සාමාජිකයින් 500 | කොළඹ 07, ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානය |
| 2 | "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන - කොස්ගම | 2019.06.17 | රණවිරු සාමාජිකයින් 150 | කොස්ගම රණවිරු ගම්මානය |
| 3 | "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන - දොඹගොඩ | 2019.06.24 | රණවිරු සාමාජිකයින් 200 | දොඹගොඩ රණවිරු ගම්මානය |
| 4 | "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන සහ අඹ පැළ ප්‍රදානය - අනුරාධපුර | 2019.07.22 | රණවිරු ඥාතීන් 400 | තඹුත්තේගම වෙහෙරගල බෞද්ධ මධ්‍යස්ථානය |
| 5 | "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන - කොත්මලේ | 2019.08.13 | රණවිරු සාමාජිකයින් 150 | කොත්මලේ ප්‍රා:ලේ: කාර්යාලය |
| 6 | "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන - නාවුල | 2019.08.19 | රණවිරු සාමාජිකයින් 250 | නාවුල අරංගල විහාරය |
| 7 | මාතලේ දිස්ත්‍රික් රණවිරු දූදරු පෞරුෂ සංවර්ධන වැඩමුළුව | 2019.08.29 | රණවිරු සාමාජිකයින් 250 | රත්තොට ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය |
| 8 | මහනුවර දිස්ත්‍රික් රණවිරු දූ දරු පෞරුෂ සංවර්ධන වැඩමුළුව සහ අඹ පැළ ප්‍රදානය | 2019.08.30 | රණවිරු සාමාජිකයින් 250 | මහනුවර පොලිස් ශ්‍රවනාගාරය |
| 9 | බස්නාහිර පළාත් රණවිරු දූදරු පෞරුෂ සංවර්ධන වැඩමුළුව | 2019.08.31 | රණවිරු සාමාජිකයින් 150 | විපස්සනා භාවනා මධ්‍යස්ථානය |
| 10 | ගාල්ල දිස්ත්‍රික් "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 2019.09.10 | සංසද සංමාජිකයින් 60 | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 12 | අලව්ව "රණවිරු සිත් සුවය" ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 2019.10.21 | සංසද සංමාජිකයින් 400 | අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |





රණවිරු සිත් සුවය වැඩසටහනේ විශේෂ අවස්ථා

**1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතින් ආයතනයට පවරා ඇති කර්තව්‍ය ඉටු කිරීමේ දී මුහුණ දී ඇති මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ ගැටලුව...**

යුද ව්‍යසනය හේතු කොටගෙන ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් හා ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙත පනතින් පවරා ඇති කර්තව්‍ය ඉටු කිරීමේදී විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලැබුණු ප්‍රධානතම මාර්ගය ලොතරැයි මණ්ඩල අරමුදල් ලැබීමය. ලොතරැයි මණ්ඩල ලැබීම් 2017 වර්ෂයේ හා 2018 වර්ෂයේදී 50% කින් පමණ අඩුවීම හා පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන පරිත්‍යාග වසරින් වසර අඩු වීම හේතු කොටගෙන සහ සේවක වැටුප්, දීමනාවලට අමතරව ආයතනයේ සියලු පුනරාවර්තන වියදම් ආයතනික අරමුදලින් දැරීම හේතු කොටගෙන වර්තමානයේ අධිකාරිය උග්‍ර මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇත.

2000 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා ලොතරැයි මණ්ඩල ලැබීම් පිළිබඳ තොරතුරු හා සංවර්ධන ව්‍යාපෘති සඳහා අධිකාරිය වාර්ෂිකව වැය කර ඇති මුදල් ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු පහතින් සඳහන් වේ.

| **2000 වර්ෂයේ සිට 2018 දක්වා ලොතරැයි ආදායම් ලැබීම් සහ ව්‍යාපෘති පිරිවැය - රණවිරු සේවා අධිකාරිය** | | | |
|---|---|---|---|
| වර්ෂය | කාලය | ලොතරැයි ආදායම (රු.මිලියන) | මුළු ව්‍යාපෘති පිරිවැය(රු.මිලියන) |
| 2000 | ජූනි සිට දෙසැම්බර් | 24.06 | - |
| 2001 | ජනවාරි සිට දෙසැම්බර් | 43.42 | 50.8 |
| 2002 | ජනවාරි සිට දෙසැම්බර් | 59.36 | 93.8 |
| 2003 | ජනවාරි සිට දෙසැම්බර් | 107.06 | 57 |
| 2004 | ජනවාරි සිට දෙසැම්බර් | 108.22 | 33 |
| 2005 | ජනවාරි සිට දෙසැම්බර් | 120.44 | 246 |
| 2006 | ජනවාරි සිට දෙසැම්බර් | 109.61 | 171 |
| 2007 | ජනවාරි සිට දෙසැම්බර් | 73.27 | 86 |
| 2008 | ජනවාරි සිට දෙසැම්බර් | 69.82 | 69.17 |
| 2009 | ජනවාරි සිට දෙසැම්බර් | 83.31 | 133.85 |
| 2010 | ජනවාරි සිට දෙසැම්බර් | 80.54 | 81.41 |
| 2011 | ජනවාරි සිට දෙසැම්බර් | 93.86 | 96.31 |
| 2012 | ජනවාරි සිට දෙසැම්බර් | 103.82 | 124.71 |
| 2013 | ජනවාරි සිට දෙසැම්බර් | 87.35 | 160.71 |
| 2014 | ජනවාරි සිට දෙසැම්බර් | 98 | 342.52 |
| 2015 | ජනවාරි සිට දෙසැම්බර් | 97.79 | 370.88 |
| 2016 | ජනවාරි සිට දෙසැම්බර් | 93.47 | 398.4 |
| 2017 | ජනවාරි සිට දෙසැම්බර් | 52.08 | 421.92 |
| 2018 | ජනවාරි සිට දෙසැම්බර් | 43.14 | 389.81 |
| 2019 | ජනවාරි සිට දෙසැම්බර් | 35.51 | 374.75 |
| | එකතුව | **1,584.13** | **3,702.04** |




2000 - 2014 දක්වා කාල පරාසය තුළ ලැබුණු ලොතරැයි මණ්ඩල ප්‍රදානයන් රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරීමෙන් හා අධිකාරියේ සහන ණය අරමුදලේ ආයෝජනය කිරීමෙන් අරමුදල් කළමනාකරණය කර ගැනීමට ආයතනය සමත් වී ඇත.

| **2002 – 2019 සහන ණය අරමුදල හිඟ හිටි ණය ශේෂයන් (අධිකාරියට අයවිය යුතු ණය) පිළිබඳ තොරතුරු** | |
|---|---|
| **වර්ෂය** | **මුදල (රු:මිලියන)** |
| **2002** | **1.9** |
| **2003** | **2** |
| **2004** | **14** |
| **2005** | **94.66** |
| **2006** | **175.18** |
| **2007** | **398.46** |
| **2008** | **374.18** |
| **2009** | **300** |
| **2010** | **310.88** |
| **2011** | **341.7** |
| **2012** | **349.56** |
| **2013** | **237.15** |
| **2014** | **297.79** |
| **2015** | **286.92** |
| **2016** | **217.56** |
| **2017** | **131** |
| **2018** | **83.65** |
| **2019** | **89.02** |




එහෙත් රණවිරු ප්‍රජාව වෙනුවෙන් සුභසාධන ප්‍රදානයන් සඳහා 2015 – 2019 කාලය තුළ ප්‍රමුඛතාවයක් දැක්වීම හේතු කොටගෙන රණවිරු සේවා අධිකාරිය සතු සංචිත මුදල් හීන වී ඇත. 2019 වර්ෂය සඳහා අනුමත අයවැය යටතේ රු. මිලියන 36 ක පමණ මුදලක් සුභසාධන වැඩසටහන් සඳහා සංචිත මුදලින් වැය කිරීමට සැලසුම් කරන ලදී.

(රු.මි.)

| වර්ෂය | ආදායම් | | | වියදම් | | | අතිරික්තය/ (ඌනතාවය) | සංචිත වෙනස්වීම |
|---|---|---|---|---|---|---|---|---|
| | රජයේ දායකය | ආයතනයේ ආදායම් | එකතුව | පරිපාලන | රණවිරු සුභසාධන | එකතුව | | |
| 2010 | | | - | | | - | - | 450.08 |
| 2011 | 21.76 | 120.7 | 142.46 | 34.73 | 96.32 | 131.05 | 11.41 | 461.49 |
| 2012 | 35.59 | 135.56 | 171.15 | 44.14 | 124.72 | 168.86 | 2.29 | 463.78 |
| 2013 | 69.45 | 121.34 | 190.79 | 42.38 | 160.71 | 203.09 | -12.3 | 451.48 |
| 2014 | 251.82 | 129.2 | 381.02 | 51.35 | 342.52 | 393.87 | -12.85 | 438.62 |
| 2015 | 262.36 | 124.21 | 386.57 | 60.31 | 370.88 | 431.19 | -44.62 | 394 |
| 2016 | 324.1 | 120.23 | 444.32 | 77.94 | 398.4 | 476.34 | -32.02 | 361.98 |
| 2017 | 380.18 | 91.46 | 471.64 | 111.13 | 421.93 | 533.06 | -61.42 | 300.57 |
| 2018 | 386.76 | 73.16 | 459.92 | 92.56 | 389.81 | 482.37 | -22.45 | 278.12 |
| 2019 | 407.37 | 64.02 | 47.39 | 89.22 | 374.75 | 456.97 | 14.42 | 299.54 |




එමෙන්ම 2019 වර්ෂයේ අධිකාරියේ ආදායම් ලෙස ලොතරැයි මණ්ඩල ලැබීම් ලෙස රු. මිලියන 41 හා අරමුදල් ප්‍රවර්ධනයෙන්, වෙනත් ලැබීම්වලින් රු.මිලියන 15ක් ලෙස රු.මිලියන 56 ක ආදායමක් අපේක්ෂා කර ඇත. එහෙත් සත්‍ය ලෙසම උක්ත ආදායම් මගින් අධිකාරියට ලැබිය හැකි ආදායම රු. මිලියන 30 ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කළ හැකිය. එවිට ඇතිවන ආදායම් හිඟය සංචිත අරමුදලින් පියවා ගැනීමට සිදුවන අතර ඒ අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට අධිකාරියේ සංචිත මුදල තව දුරටත් අඩු වී ඇත.

ඒ අනුව 2020 වර්ෂයේ දී රණවිරු සුභසාධන වැඩසටහන් සඳහා අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතාවයකට රණවිරු සේවා අධිකාරිය මුහුණ දෙනු ඇත.

යුද්ධය අවසන් වී දශකයක් පමණ ගතව ඇති වර්තමානයේ විශේෂයෙන් යුද ව්‍යවසනය හේතු කොටගෙන ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් පුනරුත්ථාපනය හා රැකබලා ගැනීමේ කටයුතු සිදු කිරීම සංකීර්ණ කාර්යයක් වී ඇත.

ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් සඳහා අවශ්‍ය කෘත්‍රිම පාද ඇතුළු සහායක උපකරණ ලබා දීම සඳහා ඉදිරි වර්ෂය තුළ දී සැලකිය යුතු මුදලක් වැය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඊට අමතරව වාර්ෂිකව ආබාධිත රණවිරුවන් සඳහා අත්වාරු, රෝද පුටු, ශල්‍ය උපකරණ ඇතුළු සහායක උපකරණ ඉල්ලීම් පරිදි ලබා දීම සඳහා රු.මිලියන 20 ක අවම මුදලක් අවශ්‍ය වේ. තව ද රණවිරුවන් වියපත් වීමත් සමග ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ගැටලු උත්සන්න වෙමින් ඇත. ඒ සඳහා මනෝ සමාජයීය හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, මියගිය රණවිරුවන්ගේ කලත්‍රයන් හා දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු සුභසාධන කටයුතුවලටත්, වැටුප් නොලබන දෙමාපියන් වෙනුවෙන් ලබා දෙන මාපිය සුරැකුම දීමනාව ලබා දීම සඳහාත් අවම වශයෙන් මුදල් ප්‍රතිපාදන අවශ්‍ය වී ඇත.

ඊට අමතරව අධිකාරියේ වැටුප් හා දීමනා නොවන පුනරාවර්තන වියදම රු.මිලියන 35 ක් පමණ වේ. ඒ අනුව වාර්ෂික අයවැයෙන් සෑම වර්ෂයකම රු.මිලියන 100 ක අවම මුදලක් මුදල් ප්‍රතිපාදන ලෙස වෙන් කර ගැනීම අත්‍යවශ්‍යවී ඇත. වාර්ෂික අයවැයෙන් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට

අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබෙන තත්ත්වයන් යටතේ රට තුළ සාමය ස්ථාපිත කිරීමට ශරීරාංග පරිත්‍යාග කළ රණවිරුවන් 20353 දෙනෙකු හා ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන් 29932 පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ මනෝ සමාජයීය සුභසාධන කටයුතු නතර වීමෙන් ආරක්ෂක අංශ සාමාජික සාමාජිකාවන් හා රණවිරු ප්‍රජාව රජය කෙරෙහි තිබූ විශ්වාසය පළුදු වීමට හේතු වනු ඇත.

## <u>මුදල් ප්‍රතිපාදන නොමැතිවීම හේතු කොටගෙන දැනට නතර වී ඇති ව්‍යාපෘතින්</u>

<u>රණවිරු ගම්මාන ව්‍යාපෘතිය</u>

1. යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්
2. ආදර්ශ රණවිරු ගම්මාන වැඩසටහන්
3. රණවිරු ගම්මාන ගෙවතු වගා වැඩසටහන්
4. රණවිරු ගම්මාන සාමාජික සාමාජිකාවන්ගේ සුහදතා වර්ධන වැඩසටහන්

<u>රණවිරු අනුස්මරණ වැඩසටහන</u>

1. උත්තම පූජා ප්‍රණාම පදක්කම් ප්‍රදාන උත්සව

<u>සෞඛ්‍ය අංශය</u>

1. වෛද්‍ය සායන
2. අක්ෂි සායන
3. වෛද්‍ය ණය
4. මනෝ විද්‍යා පුහුණු වැඩමුළු
5. සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්

<u>පුනරුත්ථාපන හා රැක බලා ගැනීමේ වැඩසටහන</u>

1. ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු

<u>රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන්</u>
1. නායකත්ව පුහුණු වැඩසටහන්
2. සංසද හා අන්තර් සංසද සාමාජික සාමාජිකාවන් අතර සුහදතා වර්ධනය කිරීමේ "සංසද පොකුරු වැඩසටහන්"
3. අන්තර් සංසද ක්‍රියාකාරකම්
4. හදිසි ආපදා ආධාර (රණවිරුවා මියයාමකදී හා ස්වභාවික ආපදා අවස්ථාවන්හිදී මූල්‍ය ආධාර ප්‍රදානය)
5. දිවයින පුරා ක්‍රියාත්මක රණවිරු සංසදවල නිලධාරීන්ගේ නියෝජිත සහභාගීත්වය සහිතව ජාතික වශයෙන් පවත්වනු ලබන "සංසද සම්මේලන"
6. රණවිරු සේවා අධිකාරියේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය නිරීක්ෂණය,රණවිරු ප්‍රජාවේ අවශ්‍යතා හඳුනා ගැනීම හා මනෝසමාජයීය මැදිහත්වීම අරමුණු කොට දින 07 ක්ෂේත්‍ර නිරීක්ෂණ

<u>අධ්‍යාපන ව්‍යාපෘතිය</u>

1. පරිගණක පුහුණු මධ්‍යස්ථාන
2. අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආධාර පිරිනැමීම

3. සංස්කෘතික පුහුණු මධ්‍යස්ථාන
4. විදේශීය ශිෂ්‍යත්ව ( අධ්‍යාපන හා ක්‍රීඩා)

**රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම හා සේවා නියුක්තිය තහවුරු කරලීම සඳහා ආදායම් උත්පාදන වැඩසටහන්**

1. ස්වයං රැකියා ආධාර (රුපියල් 50000ක උපරිමයකට යටත්ව)
2. ස්වයං රැකියා වැඩමුළු (ව්‍යවසායකත්ව දැනුම හා තාක්ෂණික/ශිල්පීය දැනුම ලබාදීම)

**නිවාස ණය**

1. නිවාස ආධාර

**කාන්තා සංවර්ධන වැඩසටහන**

විශේෂයෙන් ජීවිත පරිත්‍යාග කරන ලද රණවිරුවන්ගේ කලත්‍රයන්, මව්වරුන් හා රණවිරු දියණියන්ගේ මනෝ සාමාජයීය, සෞඛ්‍ය හා ආර්ථික සංවර්ධනය ඉලක්ක කොට ක්‍රියාත්මක විශේෂ කාන්තා සංවර්ධන වැඩසටහන්

1. රණවිරු කාන්තා සංවර්ධන වැඩසටහන්
2. රණවිරු කාන්තා බැහැරගත පුහුණු වැඩමුළු
3. ආර්ථික බලගැන්වීම
4. නායකත්ව පුහුණු වැඩසටහන්

# විගණකාධිපති වාර්තාව
# 2019

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඑෆ්/ඩී/ආර්එස්ඒ/ 01/19/15  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2020 ජූලි 31 දින

සභාපති

රණවිරු සේවා අධිකාරිය

**රණවිරු සේවා අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - ලේකම්- ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඑෆ්/ඩී/ආර්එස්ඒ/ 01/19/15   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2020 ජූලි 31 දින

සභාපති

රණවිරු සේවා අධිකාරිය

**රණවිරු සේවා අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රණවිරු සේවා අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලට ගෙන තිබුණු රු.4,309,928 ක වත්කම් සඳහා සිදුකළ යුතුව තිබුණු රු. 473,448 ක ක්‍රමක්ෂය මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාවිතා නොකරන ලද රු 88,614 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය වටිනාකමද ඇතුලත් කර සමාලෝචිත වර්ෂය තුළදී ගොඩනැගිලි වශයෙන් රු.1,651,044 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) භාණ්ඩාගාර බිල්පත් සඳහා ආයෝජන පොලී අදායම සමාලෝචිත වර්ෂය සඳහා රු.1,615,986 ක් වුවද රු.1,910,908 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම නිසා වාර්ෂික පොලී ආදායම රු.294,922 කින් හා ලැබිය යුතු පොලී ආදායම රු.290,882 කින් වැඩියෙන් දක්වා තිබුණි. එසේම ස්ථාවර තැන්පතු මත පොලී ආදායම රු.194,696 ක් අඩුවෙන් හා ලැබිය යුතු පොලිය රු.45,928 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි පදනම් නියමයන්ට පටහැනිව අධිකාරිය වෙත 2015 දී පරිත්‍යාග ලෙස ලැබුණු රු.152,000 වටිනා ලැප්ටොප් පරිගණක ලැබුණු දින සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණු නමුත් ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.96,946 ක ක්ෂය ප්‍රතිපාදනයන් සිදු කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනාගත සේවක වැටුප් වැඩිවීම, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කරගත යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවකයින් විසින් අවසාන වරට ලබාගත් වැටුප හා සේවා කාලය පදනම් කරගෙන සේවකයින් 63 ක් සඳහා පාරිතෝෂිත ලෙස එකතුව රු.16,922,149 ක වෙන් කිරීම් සිදුකර තිබුණද පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා එපරිදි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව (ශ්‍රී.ලං.වි.ප්‍ර) මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය හා සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව *පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව .*

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) මු.රෙ. 371 | කාර්යය නිමකල වහාම අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවත් 2014 වර්ෂය තුලදී නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 5 කදී ලබා දී තිබුණු එකතුව රු.1,830,450 ක්වූ මුදල් අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දින දක්වා පියවා නොතිබුණි. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 වගන්තිය අනුව සෑම මුදල් වර්ෂයකම ජුනි මස 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කල යුතු වුවත් 2019 වර්ෂයට අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි |
| (ඇ) 2002 මැයි 24 දිනැති අංක 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අධිකාරිය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017, 2018 වර්ෂයන්ට අදාල කාර්යසාධන වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාගත කර නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

ආබාධිත රණවිරුවන් සඳහා ඉල්ලුම්කල රෝද පුටු, අත්වාරු , කෘතිම පාද , උපැස් යුගල් ප්‍රමාණය ඒකක 354 ක්, 583ක් ,472 ක් හා 165 ක් විය. එසේ වුවද සත්‍ය වශයෙන් ලබා දී තිබුණේ පිළිවෙලින් 25ක් ,29ක් , 9ක් හා 0ක් පමණි. මේ අනුව රණවිරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමේ පරමාර්ථයට අධිකාරිය ප්‍රමුඛතාවය දී කටයුතු කර නොතිබුණි. එසේම මේ සඳහා 2019 ජූලි 11 දින අපි වෙනුවෙන් අපි අරමුදලින් රු.මිලියන 10 ක මුදලක් අධිකාරිය වෙත ලැබී තිබුණු නමුත් අධිකාරිය විසින් සහය උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබූ නිසා මෙම මුදල් 2019 දෙසැම්බර් 31 දින නැවත එම අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

-----------------------------

(අ) රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මස දක්වා මාස 18 ක කාලය තුල ගිණුම් හිමියන් දෙදෙනකු වෙත අවිධිමත් ලෙස රු.5,940,500 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මුදලින් රු.4,978,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රතිලාභීන් ජීවත්ව සිටිදැයි තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රතිලාභීන් 237 දෙනෙකු වෙනුවෙන් මාපිය සුරුකුම් දීමනා වැඩසටහන යටතේ ලබාදුන් රු.17,550,489 ක් වසර 01 සිට වසර 10 ක කාලයක් ප්‍රතිලාභීන්ගේ ගිණුම්වල නිෂ්කාර්යව තිබුණි.

(ඇ) ප්‍රතිලාභීන් මිය ගිය අවස්ථාවලදී හා රණවිරු වැටුපෙන් සියයට 25 ක දීමනාව ගෙවා තිබෙන අවස්ථා වල දී මා පිය සුරුකුම් ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන්ගේ ගිණුම් අවලංගු කර එම මුදල් අධිකාරිය වෙත නැවත ප්‍රේෂණය කර ගත යුතු වුවත් අවලංගු කළ යුතු ප්‍රතිලාභීන් 74 දෙනෙකුගේ ගිණුම්වල තිබුණු රු.2,493,756 ක් 2019 දෙසැම්බර් 31 දින විටත් නැවත අයකර ගෙන නොතිබුණි.

(ඈ) අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ පිහිටි පරිත්‍යාග වශයෙන් ලැබුනු ඉඩමක් හා ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 10.1 ක් යොදවා ප්‍රතිසංස්කරණය කර බහුකාර්ය පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් යොදා ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් සැලසුම් කළ පරිදි කටයුතු නොකිරීම නිසා වටිනාකම රු.මිලියන 26.7 ක් වූ ඉහත කී ඉඩම සහ ගොඩනැගිල්ල අනාරක්ෂිතව හා නිෂ්කාර්යව තිබුණි.

(ඉ) ක්‍රියාන්විතයේදී ආබාධිත වූ හා දිවි පිදූ රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් 2016 වර්ෂයේ යෝජනා කරන ලද විරුසුමිතුරු ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පූර්ණ නිවාස 1464 ක් හා අර්ධ නිවාස 1275 ක් ලෙස නිවාස 2739 ක් වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි. එසේ වුවද, 2019 වර්ෂ අවසන් වන විට විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් පූර්ණ නිවාස 195 ක හා අර්ධ නිවාස 298 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වසර තුනක් අවසන් වන විට පූර්ණ නිවාස සියයට 13 ක් හා අර්ධ නිවාස සියයට 23 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

(ඊ) 2019 වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුව මගින් ආබාධිත රණවිරුවන්ට උපකරණ මිලදී ගැනීමට රු. 2,700,000 ප්‍රතිපාදන වෙන්වී තිබුණි. එම මුදලින් රු.1,492,888 ක් පමණක් එනම් සියයට 55 ක් උපයෝජනය කර තිබුණු අතර ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදන රු. 480,000 ක් උපයෝජනය කර නොතිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

# අවසන් මූල්‍ය ප්‍රකාශනය
# 2019

# රණවිරු සේවා අධිකාරිය
## 2019 -12- 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන් | 2019 | 2019 | 2018 | 2018 |
|---|---|---|---|---|---|
| | | රු.ශත | රු.ශත | රු.ශත | රු.ශත |
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 | | 212,490,032.70 | | 195,368,953.76 |
| තැන්පතු | 2 | | 310,141.38 | | 335,141.38 |
| කලින් ගෙවීම් | 3 | | 295,745.70 | | 231,930.29 |
| ලැබිය යුතු ණය හා පොලී | 4 | 89,019,645.02 | | 83,689,967.50 | |
| අඩුකලා | | | | | |
| අඩමාණ ණය වෙන් කිරීම් | | 650,255.23 | 88,369,389.79 | 591,634.24 | 83,098,333.26 |
| ලිපිද්‍රව්‍ය තොග | 5 | | 1,314,293.28 | | 1,975,657.08 |
| එකතුව 01 | | | 302,779,602.85 | | 281,010,015.77 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ස්ථාවර තැන්පතු | 6 | | 28,000,000.00 | | 28,000,000.00 |
| නොනිමි වැඩ | 7 | | - | | |
| යටිතල.පිරියත හා උපකරණ | 8 | | 23,161,402.90 | | 17,227,899.52 |
| ඉඩම් හා ගොඩනැගිලි | 9 | | 292,570,464.18 | | 294,520,491.58 |
| එකතුව 02 | | | 343,731,867.08 | | 339,748,391.10 |
| **මුළු වත්කම් (03=01+02)** | | | **646,511,469.93** | | **620,758,406.87** |
| **බැරකම්** | | | | | |
| **ජංගම බැරකම්** | 10 | | 8,843,519.35 | | 12,143,994.50 |
| එකතුව 04 | | | 8,843,519.35 | | 12,143,994.50 |
| **ජංගම නොවන බැරකම්** | 11 | | 26,576,700.16 | | 22,715,134.83 |
| එකතුව 05 | | | 26,576,700.16 | | 22,715,134.83 |
| **මුළු බැරකම් (06=04+05)** | | | 35,420,219.51 | | 34,859,129.33 |
| **ශුද්ධ වත්කම් (03-06)** | | | **611,091,250.42** | | **585,899,277.54** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | | | |
| රණවිරු දූදරු සුවසෙත අරමුදල | | | 76,710.00 | | 76,710.00 |
| සේවක ණය චක්‍රිය අරමුදල | | | 10,825,862.50 | | 10,387,500.44 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | 116,054,268.58 | | 104,707,082.46 |
| සමුච්චිත අතිරික්තය/(ඌණතාවය) | | | 484,134,409.33 | | 470,727,984.64 |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය (01+02-06)** | | | **611,091,250.42** | | **585,899,277.54** |

ඉහත මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය අංක 02 සිට 26 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්වල ගැලපීම් සමග කියවිය යුතුය.

කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි පිළියෙල කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශණය ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය විසින් භාරගන්නා ලදී. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශණ අත්සන් කිරීමේ හා නිකුත් කිරීමේ අධිකාරී බලය සභාපතිතුමා, උප සභාපතිතුමිය හා සහකාර අධ්‍යක්ෂ මූල්‍ය වෙත 2020-02-28 දින ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| හර්ෂි ද සිල්වා | එස් එල් කෝට්ටේගොඩ | මේජර් ජෙනරල් (විශ්‍රාමික) නන්දන සේනාධීර |
| සහකාර අධ්‍යක්ෂ මූල්‍ය | උප සභාපතිනිය | ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ |
| රණවිරු සේවා අධිකාරිය | රණවිරු සේවා අධිකාරිය | සභාපති |
| | | රණවිරු සේවා අධිකාරිය |

## රණවිරු සේවා අධිකාරිය
## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| | | රු.ශත | රු.ශත |
| **ආදයම්** | | | |
| රජයේ දායකය (පුනරාවර්තන) | 12 | 407,372,825.00 | 386,762,994.23 |
| සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදයම | | 35,506,340.00 | 43,136,528.00 |
| පොලී ආදයම | 13 | 17,428,336.80 | 13,299,718.86 |
| සේවක ණය පොලී ආදයම | | 438,362.06 | 381,698.58 |
| සේවා ගාස්තු | 14 | 4,193,086.94 | 7,631,911.76 |
| රණවිරු කොඩි අලෙවි ආදයම | 15 | 3,344,015.54 | 4,500,000.00 |
| පරිත්‍යාග | 16 | 2,425,000.00 | 1,619,550.00 |
| වාහන අලෙවි ආදායම | 17 | - | 1,893,547.95 |
| විරු සුමිතුරු නිවාස ව්‍යාපෘති ලැබීම් ගිණුම | | | - |
| සෙන්හිරු සියපත් ව්‍යාපෘති සඳහා ලැබීම් ගිණුම | | | - |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | | | |
| අඩමාණ ණය අධි වෙන්කිරීම් | | | 408,902.05 |
| වෙනත් ලැබීම් | 18 | 683,084.53 | 291,809.52 |
| **මුළු ආදයම** (01) | | 471,391,050.87 | 459,926,660.95 |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 19 | 49,341,387.32 | 52,114,140.08 |
| ගමන් වියදම් | 20 | 1,086,301.00 | 1,286,754.00 |
| සැපයීම් | 21 | 3,382,754.11 | 5,324,329.22 |
| නඩත්තු වියදම් | 22 | 2,170,733.76 | 3,927,087.52 |
| ගිවිසුම්ගත සේවා | 23 | 14,465,480.50 | 19,450,065.52 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 24 | 2,712,676.11 | 2,011,278.25 |
| ව්‍යාපෘති මෙහෙයුම් වියදම් | 25 | 374,748,496.17 | 389,812,548.99 |
| ක්ෂය කිරීම | | 8,410,616.48 | 7,708,395.77 |
| මූල්‍ය වියදම් | 26 | 647,584.62 | 739,964.58 |
| භාණ්ඩ ඌනතාවය කපා හැරීම | | 812.42 | |
| **මුළු වියදම** (02) | | 456,966,842.50 | 482,374,563.93 |
| **කාල පරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌනතාවය) (01-02)** | | 14,424,208.37 | (22,447,902.98) |

## රණවිරු සේවා අධිකාරිය
### 2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | රු.ශත | රු.ශත |
| අතිරික්තය/(ඌනතාවය) | | 14,424,208.37 | (22,447,902.98) |
| **ගැළපීම්** | | | |
| ක්ෂය කිරීම | | 8,410,616.48 | 7,708,395.77 |
| පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම | | 2,522,020.77 | 2,391,553.63 |
| භාණ්ඩ පරිත්‍යාග කිරීම් | | 27,022.00 | |
| වාහන අලෙවි ආදායම | | | (1,893,547.95) |
| පොලී ආදයම | | (17,428,336.80) | (13,299,718.86) |
| භාණ්ඩ ඌනතාවය කපා හැරීම | | 812.42 | |
| අතිවිශේෂ අයිතම | | 1,973,673.46 | 5,035,357.61 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය(ඌනතාවය)** | | **9,930,016.70** | **(22,505,862.78)** |
| ලිපිද්‍රව්‍ය තොග (වැඩිවීම)/අඩුවීම | | 661,363.80 | (781,132.26) |
| තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | 25,000.00 | 252,000.00 |
| කලින් ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | | (63,815.41) | 49,748.96 |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | | (3,300,474.58) | (3,648,845.74) |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | | (5,271,056.53) | 47,365,915.22 |
| පාරිතෝෂික දීමනා ගෙවීම | | 405,066.89 | (1,197,181.52) |
| මෙහෙයුම්වලින් ජනනය වු මුදල් ප්‍රවාහය වැඩිවීම/(අඩුවීම) | | **2,386,100.88** | **19,534,641.88** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **2,386,100.88** | **19,534,641.88** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| ඉඩම් හා ගොඩනැගිලි විකුණුම්/(ගැනුම්) | | (1,651,044.90) | (10,640.00) |
| යන්ත්‍ර උපකරණ විකුණුම්/(ගැනුම්) | | (1,503,912.50) | (565,727.00) |
| ගෘහභාණ්ඩ විකුණුම්/(ගැනුම්) | | (18,400.00) | (411,373.00) |
| වාහන විකුණුම්/(ගැනුම්) | | | 1,923,000.00 |
| පොලී ආදයම | | 17,428,336.80 | 13,299,718.86 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **14,254,979.40** | **14,234,978.86** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ ප්‍රධාන ලැබීම් | | 480,000.00 | 1,500,000.00 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **480,000.00** | **1,500,000.00** |
| මුදල් හා මුදල්වලට ආසන්න දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | **17,121,080.27** | **35,269,620.74** |
| | | - | |
| කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන් | | **195,368,953.74** | 160,099,333.00 |
| කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන් | | **212,490,034.01** | **195,368,953.74** |

## රණවිරු සේවා අධිකාරිය
### 2019-12-31 දිනෙන් අවසන් වසර සඳහා මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සටහන් | රණවිරු දූ දරු සුවසෙත අරමුදල | සේවක ණය චක්‍රිය අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත | | රු.ශත |
| **2018.01.01** දිනට ශේෂය | | 76,710.00 | 10,005,801.86 | 104,707,082.46 | 423,766,244.52 | 538,555,838.84 |
| ගැළපිම් (02) | 27 | - | | | 4,814,169.43 | 4,814,169.43 |
| ඉඩම පරිත්‍යාග (03) | | | | | 60,590,000.00 | 60,590,000.00 |
| භාණ්ඩ පරිත්‍යාග (04) | 28 | | | | 44,240.00 | 44,240.00 |
| ගොඩනැගිලි පරිත්‍යාග | | | | | 5,563,250.00 | 5,563,250.00 |
| වාහන ගිණුම | | | | | 83,006.84 | 83,006.84 |
| සේවක ණය චක්‍රිය අරමුදලට මාරු කිරීම් (06) | | - | 381,698.58 | | (381,698.58) | - |
| ඉඩම ගිණුම | | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගිණුමට මාරු කිරීම (7) | | | | | (1,303,324.58) | (1,303,324.58) |
| | | | | | | - |
| රඳවාගත් ලාභ ගිණුම | | | | | | - |
| කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌනතාවය) (08) | | | | | (22,447,902.98) | (22,447,902.98) |
| කාල පරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු අතිරික්තය/(ඌනතාවය) (08=02+03+04+05+06+07) | | 76,710.00 | 10,387,500.44 | 104,707,082.46 | 470,727,984.65 | 585,899,277.55 |
| **2019-01-01 දිනට ශේෂය (09=01+08)** | | 76,710.00 | 10,387,500.44 | 104,707,082.46 | 470,727,984.30 | 585,899,277.20 |
| | | | | | | - |
| ගැළපිම් (10) | 27 | | | | 793,888.73 | 793,888.73 |
| | | | | | | - |
| භාණ්ඩ පරිත්‍යාග (11) | 28 | | | | 27,022.00 | 27,022.00 |
| | | | | | | - |
| | | | | | | - |
| සේවක ණය චක්‍රිය අරමුදලට මාරු කිරීම් (14) | | | 438,362.06 | | (438,362.06) | - |
| | | | | | | - |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ගිණුමට මාරු කිරීම (15) | | | | | (1,400,331.18) | (1,400,331.18) |
| | | | | | | - |
| කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌනතාවය) (16) | | | | 11,347,186.12 | 14,424,208.37 | 25,771,394.49 |
| කාලපරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු අතිරික්තය/(ඌනතාවය) (17=09+10+11+12+13+14+15+16) | | - | 438,362.06 | 11,347,186.12 | 13,406,425.86 | 25,191,974.04 |
| **2019-12-31 දිනට ශේෂය (17=08+17)** | | 76,710.00 | 10,825,862.50 | 116,054,268.58 | 484,134,410.16 | 611,091,251.24 |

**රණවිරු සේවා අධිකාරිය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2018-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

## 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් ප්‍රතිපත්ති

**1) සංස්ථාපිත විස්තරය**

**1.1) වාර්තා කරන ගිණුම්කරණ ඒකකය සහ පදනම**

රණවිරු සේවා අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් පවරනු ලැබූ වර්ෂ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනත මගින් 1999 වසරේ දෙසැම්බර් 23 වන දින ගැසට් නිවේදනයෙන් නිවේදනය කළ රාජ්‍ය ආයතනයකි. 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 3 වන උපවගන්තිය පසුව පිළිවෙළින් 2009 අංක 7 හා 2012 අංක 20 දරන රණවිරු සේවා අධිකාරි (සංශෝධන) පනත මගින් සංශෝධනය විය.

**1.2) මූලික අරමුණ, කර්තව්‍ය හා කාර්ය ස්වභාවය**

රණවිරු සේවා අධිකාරි පනතින් පවරා ඇති ඉලක්ක ගත කණ්ඩායමේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම මූලික අරමුණ වේ.

මෙම අරමුණ පහත දක්වා ඇති සයවිධ කාර්යයන්හි සුභසාධනයට ප්‍රවර්ධනය කිරීම මූලික කොට ගෙන ගෙන පනතින් සිදුවේ.

I. නිවාස සැපයීම හා එහි ලා සහාය වීම.
II. ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ ඔවුන්ගේ පුනරුත්ථාපනය
III. වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම
IV. අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශ ලබා ගැනීමට අවස්ථා සලසා දීම.
V. ඵලදායි සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීම
VI. ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමට කාර්මික,කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසාය පිහිටුවීම

**1.3) ඉලක්කගත කණ්ඩායම**

සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන් සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්

**1.4) ප්‍රධාන කාර්යාල ලිපිනය**

ප්‍රධාන කාර්යාලය. අංක 443, ගාලු පාර , කොළඹ 03 පිහිටා ඇත.

**1.5) සේවකයන් ගණන**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/C2/2/44 හා 2012.10.16 දිනැති ලිපිය අනුව අනුමත මුළු සේවක සංඛ්‍යාව 89 (සභාපති, උප සභාපති නොමැතිව) 2019.12.31 දිනට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව 85කි.

**ගිණුම් වර්ෂය**

අධිකාරියේ ගිණුම් වර්ෂය ලිත් වර්ෂයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2019.01.01 දින සිට 2019.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහාය.

**1.6) ගිණුම් වාර්තා අනුමත කල යුතු දිනය**

ගිණුම් වර්ෂය අවසන් වී ලිත් වර්ෂයේ දින 60 ක් ඉක්ම යාමට පෙර අනුමත කළ යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශ 2020 පෙබරවාරි දින 28 කළමනාකරණ මණ්ඩලය අනුමත කරන ලදී.

**රණවිරු සේවා අධිකාරිය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.......**

**2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**02) පිළියෙල කිරීමේ පදනම හා අනුකූලතාවය**

**2.1) පිළියෙල කිරීමේ පදනම**

අධිකාරියේ ශේෂ පත්‍රයේ දැක්වෙන පහත අයිතම හැර මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ඓතිහාසික පිරිවැයට පිළියෙල කර ඇත.

| අයිතමය | පිළියෙල කිරීමේ පදනම |
|---|---|
| වාහන | ශුද්ධ උපලබ්ධි අගය |

**2.2) අනුකූලතා ප්‍රකාශය**

**මෙම මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සමග සටහන් අන්තර්ගතවේ.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2009 හා 2012 වසරවලදී හඳුන්වාදී ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව; ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 (භාණ්ඩ සහ වැඩ) හා 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු යන පනත් ආවරණය වන පරිදි ඊට අනුගත ලෙස පිළියෙල කර ඇත. යම් ගනුදෙනුවක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් ආවරණය නොවන අවස්ථාවක ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති යොදාගන්නා අතර එයිනුත් අවරණය නොවන අවස්ථාවක වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දී ඇති “Sri Lanka Statement of recommended Practise for not-for profit organization” අනුව කටයුතු කරනු ලැබේ.

**2.3)** මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි ඡේද අංක 19 අනුකූලව රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධිකාරියේ කළමණාකරණ මණ්ඩලය සතුය.

**2.4) මූලික හා ඉදිරිපත් කරන මුදල් වර්ග**

අධිකාරියේ මූලික මුදල් වර්ගය වනුයේ ශ්‍රී ලංකා රුපියල් වන අතර, එය මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරිමේදීත් භාවිත කර ඇත.

**රණවිරු සේවා අධිකාරිය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.......**

**2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**1) විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**මෙම මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු පරිශීලකයන්ට වඩාත් හොඳින් තේරුම් ගැනීමට අදාළව කළමණාකරණ මණ්ඩලය විසින් යෝග්‍ය යැයි සිතන අමතර තොරතුරු මෙම කොටසින් ඉස්මතු කර පෙන්වයි.**

මෙම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් ප්‍රතිපත්ති නිරන්තරයෙන් සෑම කාල වකවානුවකටම අනුකූල කරගෙන පිළියෙල කර ඇත. **වර්ෂය තුළ වෙනස් වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත්ව අධිකාරී මූල්‍ය තත්ත්වයට බලපාන විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම කොටසින් සාරාංශව ඉදිරිපත් කර ඇත.**

**3.1) රජයෙන් ලැබූ ප්‍රදාන ගිණුම් තැබීම**

**පුනරාවර්තන ප්‍රදාන**

රජයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන අදායම් වියදම් ගිණුමට ගැළපීම් කරනු ලැබේ.

**ප්‍රාග්ධන ප්‍රදාන**

අධිකාරියේ කටයුතු සඳහා ලැබෙන ප්‍රග්ධන ප්‍රදාන රජයේ දායක (ප්‍රාග්ධන) ගිණුමට ගිණුම්ගත කරන අතර වෙනත් ආයතන වෙත මාරු කිරීම සඳහා ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන එම ආයතන නමින් ඇති ගිණුමට ගිණුම්ගත කරන අතර වෙනත් ආයතන වෙත මාරුකිරිම සඳහා ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන එම ආයතන වෙත මාරු කිරීම සඳහා ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන එම ආයතන නමින් ඇති ගිණුමකට ගිණුම්ගත කරනු ලැබේ.

**3.2). වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම**

2018 වසරේ සිට මිලදී ගන්නා වත්කම්වල අගය රුපියල් 5,000 ට අඩු සහ අවුරුද්දට වඩා අඩු ආයු කාලයක් සහිත නම් එය පාරිභෝගික භාණ්ඩ ලෙස ඇතුළත් කර මෙම වර්ෂයේ වියදමක් ලෙස දක්වා ඇත. වත්කමේ පිරිවැය රු.5,000.00 ට වඩා වැඩිනම් හා ඵලදායී ජීව කාලය වසරකට වඩා වැඩිනම් ස්ථාවර වත්කමක් ලෙස සලකා ගිණුම්ගත කරනු ලැබේ.

පරිත්‍යාග වශයෙන් ලද ස්ථාවර වත්කම්වල පිරිවැය සොයා ගැනීම සඳහා වෙළඳපොළ වටිනාකම පදනම් කරගෙන ඇත. තව ද මිලදී ගැනීමේ වටිනාකම් සොයාගත නොහැකිව තිබූ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ගොඩනැගිලි යන වත්කම් කාණ්ඩයන්හි ඇතුළත් අයිතම සඳහා හුදෙක්ම තක්සේරු අගයන් ලබා ගන්නා ලද්දේ එහි පිරිවැය සඳහා මිලදී ගත් වටිනාකම සොයාගත නොහැකි වූ හෙයින් ඓතිහාසික පිරිවැයට සාධාරණ අගයක් ලබා ගැනීම සඳහාය.

රණවිරු සේවා අධිකාරිය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.......**

**2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

### 3.2.1) ස්පෘශ්‍ය වත්කම් හා ක්ෂයවීම

ක්ෂයවීම සරල මාර්ග ක්‍රමයට පිරිවැය අගය මත වාර්ෂිකව පහත සඳහන් අනුපාතයන් අනුව ගණනය කොට ඇත.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 5% |
| ගෘහ භාණ්ඩ හා උපකරණ | 15% |
| යන්ත්‍ර හා උපකරණ | 15% |
| වාහන | 20% |

### 3.3) තොග

වෙළඳ තොග, ලිපි ද්‍රව්‍ය හා පාරිභෝජන ගබඩා ද්‍රව්‍ය තොග පිරිවැයට අගය කර ඇත. පිරිවැය ගණනය කර ඇත්තේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරිමේ පදනම මතය.

### 3.4) ණයගැතියෝ හා වෙනත් අය විය යුතු වටිනාකම්

උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු කළ වටිනාකම ණයගැතියන් හා වෙනත් අයවිය යුතු වටිනාකම් දක්වා ඇත.

### 3.5) වගකීම් හා වෙන් කිරීම්

3.5.1) ජංගම වගකීම්

ජංගම වගකීම් යනුවෙන් දක්වා ඇත්තේ නියමිත දිනයන්හි දී ගෙවිය යුතු සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වටිනාකම් වේ.
ආරක්ෂක අමාත්‍යාංශය මගින් හඳුන්වාදෙන ලද විරුසර කාඩ්පත් මෙහෙයුම් වියදම ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ඇතුළුව විවිධ ආයතනවලින් ලද අනුග්‍රාහක මුදලින් දරනු ලැබේ. මෙම අනුග්‍රාහක මුදලින් අදාළ වියදම් දැරීමෙන් පසුව යම් මුදලක් ඉතිරි වේ නම් එය ත්‍රිවිධ හමුදාව හා පෙලීසිය වෙත එම ආයතන දැක් වූ අනුග්‍රාහක මුදල් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර ඇත.

රණවිරුවන් වෙත නිවාස ඉදි කර දීම සඳහා ක්‍රියත්මක විරුසර නිවාස යෝජනා ක්‍රමය සඳහා විවිධ පාර්ශවයන් විසින් අධිකාරිය වෙත ලබා දෙන ලද මුදලින් අදාළ ප්‍රතිලාභින් වෙත නිවාස ඉදි කර දීම අධිකාරියේ වගකිමක් බැවින් එම මුදල් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර ඇත.

**රණවිරු සේවා අධිකාරිය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.......**

**2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

3.5.2) වෙන් කිරීම්

පාරිතෝෂිත දීමනා වෙන් කිරීම සඳහා වන ගිණුම් ප්‍රතිපත්තිය වන්නේ සේවකයන් සේවයට බැඳුණු දින සිට සම්පූර්ණ කරන වර්ෂ ගණන අනුව ප්‍රතිපාදන වෙන් කිරීම ය.
අඩමාන ණය වෙන් කිරීම සඳහා වන ගිණුම් ප්‍රතිපත්තිය වන්නේ ශේෂපත්‍ර දිනට ණය ගැතියන්ගෙන් 1% ක් වනසේ ප්‍රතිපාදන වෙන් කිරීම ය. (අඩමාන ණය අධි වෙන් කිරීම් මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ බොල් ණයවලින් අඩු කර දක්වනු ලැබේ.)

3.5.3) අසම්භාව්‍ය වගකීම්

2019-12-31 දින වන විට විවිධ පාර්ශවයන් විසින් අධිකාරියට එරෙහිව පහත සඳහන් නඩු ගොනුකර ඇත.

| නඩු අංකය | පැමිණිලි පාර්ශවය | කාරණය |
|---|---|---|
| SCFR/24/2008 | කේ.ඒ.සීලවති | මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත. |
| SCFR/41/2016 | අධිකාරියේ නිලධාරින් 7 දෙනෙකු | මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත. |

